# සටහන

2024 ඔක්තෝබර් - දෙසැම්බර්
43 වෙළුම 10 - 12 කලාපය

2 ඕමානයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්
3 රාජ්‍ය මූල්‍ය නීති පිළිබඳ හැඳින්වීමක්
9 සංවාද සටහන 01 : ඔබගේ සේසත ම නැති කර ගන්නේ ඇයි?
14 කෘත්‍රිම බුද්ධිය මඟින් කාර්යාල කටයුතු සිදු කිරීම ගැටලු සහගතද?
19 ශ්‍රී ලංකාවේ හුවමාරු වූ අතීත වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ මූලික හැඳින්වීමක්



රු. 80/-

ISSN 1391-3697

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව




# ඕමානයේ
## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



ඕමානය, එක් පසකින් අරාබි මුහුදෙන් ද අනෙක් පැතිවලින් සෞදි අරාබිය, දකුණු යේමනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ පර්සියන් බොක්කෙන් ද සීමා වූ රාජ්‍යයකි. අරාබි අර්ධද්වීපයේ විශාලත්වයෙන් දෙවන තැන ගන්නා රට ඕමානයයි. ඕමාන බොක්ක, හෝමුස් සමුද්‍ර සන්ධිය හා අරාබි මුහුද ඔස්සේ කි. මී. 2600ක මුහුදු තීරයක් ඕමානයට අයිති වන අතර ආසියාව, යුරෝපය සහ වෙනත් රටවලට පිවිසෙන මාර්ගයක ඕමානය පිහිටා ඇති නිසා අතීතයේ සිට ම ඉතිහාසයේ වැදගත් තැනක් මෙම රටට හිමි වෙනවා.

ඕමානය ක්‍රි. පූ. යුගයේ සිට විදේශයන් සමග වෙළෙඳ සබඳතා පැවැත්වූ බව සුමේරියානු මැටි පුවරු ලිපිවලින් හෙළි වෙනවා. ක්‍රි. ව. 1507 දී පෘතුගීසීන් ඕමානයට පැමිණි අතර ඔවුන්ගේ ආධිපත්‍යය වසර 150ක් පැවතුණා. පෘතුගීසි ආධිපත්‍යයෙන් පසු ඕමානය ඉරානයේ ආධිපත්‍යයට නතු වුණා. ඉන් පසු 1744 වසරේ සිට ස්වාධීන සුල්තාන් රාජ්‍යයක් ලෙස පවතින ඕමානය 1951 දී බ්‍රිතාන්‍යය සමග අත්සන් කළ ගිවිසුමකින් එරට සමග සමීප සබඳතා ඇති කර ගත්තා. 1964 දී ඕමානයේ ඛනිජ තෙල් ඇති බව සොයා ගැනීමත් සමග එරටේ වැදගත්කම තවත් වැඩි වුණා.

දිස්ත්‍රික්ක 25කින් සමන්විත ඕමානය පාලන පහසුව සඳහා ප්‍රාන්ත 41කට බෙදා තිබෙනවා. එක් එක් ප්‍රාන්තය සඳහා ආණ්ඩුකාරයෙකු සිටින අතර රටේ පාලකයා හැඳින්වෙන්නේ සෙයිඩ් නමින්.

රටේ ජනගහනයෙන් සියයට 74ක් පමණ ඕමාන් අරාබි ජාතිකයන් වන අතර අතීතයේ ඉරානයෙන් සහ පකිස්ථානයෙන් සංක්‍රමණය වූ බලුච් ජාතිකයන් ද සියයට 20ක් පමණ එරට ජීවත් වෙනවා. රටේ ප්‍රධාන භාෂාව අරාබි වන අතර ඉංග්‍රීසි, බලුච් සහ උර්දු භාෂා ද සුළු වශයෙන් භාවිත වෙන ඕමානයේ ජනගහනයෙන් සියයට 88ක් ම ඉස්ලාම් ආගම අදහන්නන් වෙනවා.

මූලාශ්‍රය: "ආසියා මහද්වීපය" (චාමින්ද සෙනෙවිරත්න)

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය වර්ග කි.මී.<br>ගොඩ බිම් ප්‍රමාණය වර්ග කි.මී.<br>අභ්‍යන්තර ජලාශ වර්ග කි.මී. | <br>309,500<br>309,500<br>- |
| ජනගහනය (2024 ඇස්තමේන්තු) | 3,901,992 |
| ජනගහන වර්ධන වේගය (2024 ඇස්තමේන්තු) | 1.75% |
| උපත් අනුපාතය (2024 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 21.1 |
| මරණ අනුපාතය (2024 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 3.2 |
| ළදරු මරණ අනුපාතය (2024 ඇස්තමේන්තු)<br>(සජීවී උපත් දහසකට) | 13.9 |
| උපතේ දී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2024 ඇස්තමේන්තු) | 77.4 |
| දළ දේශීය නිෂ්පාදිතය (2023 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 108,19 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය<br>(2023 ඇස්තමේන්තු) | 1.3% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2022 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 44,421.2 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2022 ඇස්තමේන්තු)<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා | <br>1.8%<br>57.0%<br>44.5% |
| ශ්‍රම බලකාය (2023 ඇස්තමේන්තු) | මිලියන 2.316 |
| සේවා වියුක්තිය (2023 ඇස්තමේන්තු) | 1.46% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2019 ඇස්තමේන්තු) | 55.7 |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) (2023 ඇස්තමේන්තු)<br>දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 6.69% |
| උද්ධමන අනුපාතය (2023 ඇස්තමේන්තු) | 0.94% |
| ආනයන (2022 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 46.33 |
| ආනයන භාණ්ඩ | පිරිපහදු කළ ඛනිජ තෙල්, මෝටර් රථ, යපස්, කිරි, යකඩ පයිප්ප |
| අපනයන (2023 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 69.70 |
| අපනයන භාණ්ඩ | බොරතෙල්, ස්වාභාවික වායු, පිරිපහදු කළ ඛනිජ තෙල්, පොහොර, අර්ධ නිමි යකඩ |
| මුදල් ඒකකය | ඕමාන් රියාල් |

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

# රාජ්‍ය මූල්‍ය නීති පිළිබඳ හැඳින්වීමක්

**කේ ඒ යූ එස් කේ තිලකරත්න**
**නියෝජ්‍ය අධිකාරී**
**රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව**

## රාජ්‍ය මූල්‍ය නීති (Fiscal Rules)

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මත පනවනු ලබන දිගු කාලීන සංරෝධක රාජ්‍ය මූල්‍ය නීති ලෙස හැඳින්වේ. රජයේ ආදායම, වියදම, අයවැය හිඟය හෝ රාජ්‍ය ණය වැනි රාජ්‍ය මූල්‍ය විචල්‍ය සඳහා සංඛ්‍යාත්මක ඉලක්ක පැනවීම මෙම සංරෝධකවලට අයත් වේ. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය නීති මගින් දිගුකාලීන රාජ්‍ය මූල්‍ය තිරසරබව සහ නුබුන්වත්බව සහතික කිරීමට සහාය වන අතර සාර්ව ආර්ථික ස්ථායීතාව ඇති කර ගැනීමට හේතු වේ.

## රාජ්‍ය මූල්‍ය නීතිවල විකාශය

රාජ්‍ය මූල්‍ය නීති හඳුන්වා දීමට අනුගමනය කළ උත්සාහයන් ශත වර්ෂ එකහමාරකට වැඩි කාලයක් දක්වා දිව යයි. 19 වන ශත වර්ෂයේ මැද භාගයේ සිට ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත බොහොමයක් විසින් තුලිත අයවැය නීතිය හඳුන්වා දෙන ලදී. 1920 ගණන්වල සිට ස්විට්සර්ලන්තයේ සමහර ප්‍රාන්ත එවකට පැවති අයවැය ශේෂය පවත්වා ගෙන යෑමට වගකීමට බැඳුණි. තවද, 1917 දී එක්සත් ජනපදය විසින් රාජ්‍ය මූල්‍ය නීති ලෙස නිර්වචනය කළ හැකි විධිවිධාන ඇතුළත් පළමු නීතිය ඉදිරිපත් කරන ලදී. මේ අනුව, Liberty Bond Act යටතේ ෆෙඩරල් රජයේ දළ ණය ගැතිබව පිළිබඳ ව නීතිමය සීමාවක් ඇති කරන ලදී.

II වන ලෝක යුද්ධයෙන් පසුව 1940 ගණන්වල දී ජර්මනිය, ඉතාලිය, ජපානය සහ නෙදර්ලන්තය වැනි කාර්මික රටවල් ගණනාවක් විසින් තුලිත අයවැය නීති හඳුන්වා දෙන ලද අතර එය "ස්වර්ණමය නීතිය" (Golden Rule) ලෙස හඳුන්වන ලදී.

1960 ගණන්වල දී ඉන්දුනීසියාවේ සහ අප්‍රිකාවේ තිබූ ප්‍රංශ යටත් විජිත විසින් මහ බැංකු වැනි තීරණය කර ගත් දේශීය මූල්‍ය මාර්ග මගින් අයවැය හිඟය පියවීම සීමා කිරීම හෝ තහනම් කිරීම කරන ලදී. 1990 ගණන්වල දී රාජ්‍ය මූල්‍ය නීති සඳහා රටවල් විසින් අණපනත් හඳුන්වාදෙන ලදී. මෙහි ආරම්භකයා වශයෙන් නවසීලන්තය විසින් 1994 දී රාජ්‍ය මූල්‍ය වගකීම් පනත හඳුන්වා දෙන ලදී. ඒ අනුව, කාර්මික හා නැගී එන රටවල් බොහොමයක් විසින් රාජ්‍ය මූල්‍ය නීති සඳහා පනත් සම්මත කර ගන්නා ලදී.

මීට අමතර ව, මෙම සියවසේ පළමු දශකයේ දී ඇතිවූ ගෝලීය මූල්‍ය අර්බුදයත් සමඟ බොහොමයක් රටවල රාජ්‍ය මූල්‍ය නීති තාවකාලික ව අත්හිටුවීමට සිදු විය. ඒ අනුව, එවකට පැවති රාජ්‍ය මූල්‍ය නීති සංශෝධනය කරමින් සහ නව නීති හඳුන්වා දෙමින් රාජ්‍ය මූල්‍ය නීති තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙසේ 21 වන ශත වර්ෂයේ දෙවන දශකයේ රාජ්‍ය මූල්‍ය නීතිවල සිදු කළ වෙනස්කම් දෙවන පරම්පරාවේ රාජ්‍ය මූල්‍ය නීති ලෙස හැඳින්වේ. තවද, 2014-2015 කාලයේ දී ගෝලීය වෙළෙඳ භාණ්ඩ මිල ගණන්වල සිදු වූ පහළ යෑම නිසා වෙළෙඳ භාණ්ඩ අපනයනය කරන රටවල් බොහොමයකට ද රාජ්‍ය මූල්‍ය නීති වෙනස් කිරීමට සිදු විය. ඒ අනුව, ව්‍යතිරේඛී අවස්ථා සඳහා බැහැර වීමේ වගන්ති රාජ්‍ය මූල්‍ය නීති සඳහා ඇතුළත් කරන ලදී. එසේම, කොවිඩ් -19 වසංගතයත් සමඟ බොහෝ රටවලට අනපේක්ෂිත වියදම්වලට මුහුණ දීමට සිදුවීම සහ රාජ්‍ය ආදායම් පහළ වැටීම හේතුවෙන් සිය රාජ්‍ය මූල්‍ය නීති තාවකාලික ව අත්හිටුවීම හෝ ඒවා සංශෝධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.

### රාජ්‍ය මූල්‍ය නීති වර්ග

ප්‍රධාන අයවැය නීති වර්ග හතරක් දැකිය හැකිය.

1. **ණය පිළිබඳ නීතිය**

   මෙය රාජ්‍ය ණය ප්‍රමාණය පිළිබඳ ව සීමාවක් හෝ රාජ්‍ය ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දැක්විය හැකි ය. ණය පිළිබඳ නීතිය, ණය තිරසරබව හා සම්බන්ධ වී ඇති අතර සන්නිවේදනය කිරීමට හා අධීක්ෂණය කිරීමට පහසු වේ. කෙසේ වුවද, රාජ්‍ය ණය අඩු කර ගැනීම සඳහා යම් කාලයක් අවශ්‍ය බැවින් මෙය කෙටි කාලීන ව ප්‍රයෝජනයට ගැනීම අසීරු ය. තවද විනිමය අනුපාතික අවප්‍රමාණය, පොලී අනුපාතික වෙනස් වීම වැනි රජයේ පාලනයෙන් බැහැර හේතු නිසා ණය පිළිබඳ ඉලක්ක අත්පත් කර ගැනීම අසීරු විය හැකි ය.

2. **තුලිත අයවැය පිළිබඳ නීතිය**

   මෙය සමස්ත අයවැය ශේෂය හෝ ව්‍යුහාත්මක අයවැය ශේෂය මත පැනවිය හැකි ය. තුලිත අයවැය නීතිය, පැහැදිලි මෙහෙයුම් මාර්ගෝපදේශයක් වන අතර ණය තිරසරබව හා සමීප ව සම්බන්ධ වී ඇත. එසේ ම, එය සන්නිවේදනය හා අධීක්ෂණය කිරීම පහසු ය. කෙසේ වුව ද, රජයේ පාලනයෙන් බැහැර සිදුවීම්, නිදසුනක් ලෙස ආර්ථික අවපාත හේතුකොට ගෙන තුලිත අයවැය නීතියට බලපෑම් ඇති විය හැකි ය.

3. **වියදම් පිළිබඳ නීතිය**

   මෙහි දී සමස්ත වියදම, ප්‍රාථමික වියදම හෝ පුනරාවර්තන වියදම කෙරෙහි සීමා පැනවිය හැකි ය. මෙම වියදම් පිළිබඳ සීමා සාමාන්‍යයෙන් නාමික අගය හෝ ප්‍රතිශතක වෙනස්වීම් ලෙස පනවනු ලබන අතර කලාතුරකින් අවස්ථාවල දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද පනවනු ලබයි. වියදම් පිළිබඳ නීතිය පැහැදිලි මෙහෙයුම් මාර්ගෝපදේශයක් වන අතර ආර්ථික ස්ථායීතාව ඇති කර ගැනීම සඳහා සහාය වේ. එසේ ම, රජයේ කටයුතුවල ප්‍රමාණය අඩු කෙරෙන අතර සාපේක්ෂ ව සන්නිවේදනය කිරීම හා අධීක්ෂණය කිරීම පහසු වේ. කෙසේ වුව ද, මෙම නීතිය ණය තිරසරබව හා ඍජු ව සම්බන්ධ නොවේ. තව ද, වියදම් සීමාවලට අනුගත වීම සඳහා එම සීමාවලට අදාළ නොවන වියදම් සඳහා අනවශ්‍ය ලෙස වෙනස්කම් සිදු කිරීමට ඉඩ ඇත.

4. **ආදායම් පිළිබඳ නීතිය**

   මෙම නීතිය යටතේ රාජ්‍ය ආදායම පිළිබඳ උපරිම හෝ අවම සීමාවක් පනවනු ලබන අතර මෙහි අරමුණ ජනතාව මත අධික බදු බරක් පැනවීම වළක්වා ගැනීම හෝ රජයේ ආදායම ඉහළ නංවා ගැනීමයි. මෙම නීතිය මගින් ආදායම් ප්‍රතිපත්තිය සහ පරිපාලනය වැඩිදියුණු කළ හැකි අතර රජයේ කටයුතුවල ප්‍රමාණය ද තීරණය වීමට හේතු වේ.

### විවිධ රටවල රාජ්‍ය මුදල් නීති භාවිතය

පසුගිය දශක තුන තුළ දී රාජ්‍ය මූල්‍ය නීති ලොව පුරා විශාල වශයෙන් ප්‍රචලිත වී ඇත. 1990 වන විට ජර්මනිය, ඉන්දුනීසියාව, ජපානය, ලක්සම්බර්ග් සහ එක්සත් ජනපදය යන රටවල් පහ පමණක් අවම වශයෙන් මධ්‍යම රජය ආවරණය කරමින් රාජ්‍ය මූල්‍ය නීති අනුගමනය කර තිබුණි. 2024 වන විට රටවල් සියයකට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය මූල්‍ය නීති භාවිතයට ගනිමින් සිටියි. තව ද, රාජ්‍ය මූල්‍ය නීති එකක් පමණක් භාවිතයට ගැනීම වෙනුවට නීති කිහිපයක සංකලනයක් භාවිතයට ගැනීම වර්තමානයේ ප්‍රචලිත වෙමින් පවතී. ඒ අනුව, ණය, තුලිත අයවැය හා වියදම් පිළිබඳ නීතිය යන නීති තුනේ සංකලනයක් භාවිත කිරීමට බොහෝ රටවල් පෙළඹී ඇත.

### ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය නීතිය

2003 සිට 2024 වර්ෂය තෙක් ශ්‍රී ලංකාවේ බලපැවැත්වූ රාජ්‍ය මූල්‍ය නීතිය වන්නේ 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතයි. 2024 අගෝස්තු 08 සිට 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ක්‍රියාත්මක වෙයි.

### 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත

මෙම පනත අනුව, ප්‍රධාන විචල්‍යයන් 3ක් යටතේ රාජ්‍ය මූල්‍ය නීති පනවා තිබුණි.

1) අයවැය හිඟය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)

   අයවැය හිඟය 2006 දී සියයට 5 නොඉක්මවිය යුතු අතර ඉන්පසු ව එම මට්ටමේ දිගට ම පවත්වා ගත යුතු ය.

2) රාජ්‍ය ණය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)

   2003 පනත අනුව, ආණ්ඩුවේ මුළු බැරකම් 2006 අග දී සියයට 85 සහ 2013 අග දී සියයට

සංඛ්‍යා සටහන 1

**විවිධ රටවල භාවිත වන රාජ්‍ය මූල්‍ය නීති**

| නීති වර්ගය | රට | ඉලක්කය |
|---|---|---|
| ණය | පෝලන්තය | ණය සීමාව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 60 |
| | චෙකොස්ලොවැකියාව | ණය සීමාව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 55 |
| අයවැය ශේෂය | ජෝර්ජියාව | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ඒකාබද්ධ අයවැය හිඟය සියයට 3 |
| | ජැමෙයිකාව | ප්‍රාථමික ශේෂයේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 7 |
| ආදායම | කෙන්යාව | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායම සියයට 21-22 මට්ටමේ පවත්වා ගැනීම |
| | බෙල්ජියම | ආදායමේ වර්ධනය ද.දේ.නි.යෙහි වර්ධනයට සමගාමී ව පවත්වා ගැනීම |
| වියදම | නැමීබියාව | වියදම (public expenditure) ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 33ට අඩුවෙන් පවත්වා ගැනීම |
| | තායිලන්තය | ප්‍රාග්ධන වියදම වාර්ෂික අයවැයෙන් සියයට 20කට නොඅඩු විය යුතු අතර ප්‍රාග්ධන වියදම වාර්ෂික අයවැය හිඟයට වඩා අඩු නොවිය යුතුය |

මූලයන් : European Commission 2023, IMF 2022

60 නොඉක්මවිය යුතු ය. මෙම පනත 2013 දී සංශෝධනය කෙරුණු අතර, 2013 සංශෝධිත පනතට අනුව, රජයේ බැරකම් සඳහා ඉලක්ක 2013 අග දී සියයට 80ක් සහ 2020 අග දී සියයට 60ක් ලෙස සංශෝධනය කරන ලදී. රාජ්‍ය ණය පිළිබඳ මෙම නීතිය නැවත වරක් 2021 දී සංශෝධනය කෙරුණු අතර, 2021 සංශෝධිත පනත අනුව, 2030 අග දී රාජ්‍ය ණය සියයට 60 නොඉක්මවිය යුතු ය.

3) රජයේ ඇපකර යටතේ නිකුත් කර ඇති ණය ප්‍රමාණය

මෙය පවත්නා මුදල් වර්ෂයේ සහ ඊට පෙර මුදල් වර්ෂ දෙකක ද.දේ.නි.යෙහි සාමාන්‍යයෙහි ප්‍රතිශතයක් ලෙස ගණනය කරනු ලැබේ. 2003 පනතට අනුව මෙම අනුපාතය සියයට 4.5ක් නොඉක්මවිය යුතු වූ අතර, 2013 දී එය සියයට 7.0ක්, 2016 දී සියයට 10.0ක් සහ 2021දී සියයට 15.0ක් ලෙස සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය නීති ආරම්භයේ සිට ම සතුටුදායක ප්‍රතිඵල පෙන්නුම් කර නොමැත. ශ්‍රී ලංකාව මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත මගින් රාජ්‍ය මූල්‍ය නීති පැන වූව ද, බොහෝ විට එම ඉලක්කවලින් අපගමනය වූ බවක් දක්නට ඇත.

මීට අමතර ව, රජයේ ඇපකර සහ රාජ්‍ය ණය යන ඉලක්ක වරින් වර සංශෝධනය කරන ලදී. ශ්‍රී ලංකාවට රාජ්‍ය මූල්‍ය නීති යටතේ ඇති ඉලක්ක අත්පත් කර ගැනීමට නොහැකි වීමට බලපෑ හේතු ගණනාවකි. එම ඉලක්ක අත්පත් කර ගැනීමට අදාළ ව නෛතික වශයෙන් බැඳීමක් සහිත වගවීමක් නොමැති වීම, ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා යෝග්‍ය යාන්ත්‍රණයක් නොතිබීම සහ දේශපාලනික උනන්දුව ප්‍රමාණවත් නොවීම ඒ අතර ප්‍රධාන වේ.

## 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත

මෙම පනත මගින් 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත අහෝසි කරන ලද අතර මෙම පනත යටතේ ප්‍රධාන ඉලක්ක 2ක් පිහිටුවා ඇත.

**සංඛ්‍යා සටහන 2**

**රාජ්‍ය මූල්‍ය නීති සහ සත්‍ය අගයන්**

ද.දේ.නි.%ලෙස

| පනත | ඉලක්ක වර්ෂය | ඉලක්කය | සත්‍ය අගය |
|---|---|---|---|
| 2003 පනත | | | |
| අයවැය හිඟය | 2006 | 5.0 | 7.0 |
| රජයේ ඇපකර | 2006 | 4.5 | 4.5 |
| රාජ්‍ය ණය | 2006 | 85.0 | 88.0 |
| රාජ්‍ය ණය | 2013 | 60.0 | 78.3(අ) |
| 2013 (සංශෝධිත පනත) | | | |
| අයවැය හිඟය | 2013 | 5.0 | 5.4 |
| රජයේ ඇපකර | 2013 | 7.0 | 7.0 |
| රාජ්‍ය ණය | 2013 | 80.0 | 71.8 (ආ) |
| රාජ්‍ය ණය | 2020 | 60.0 | 100.6 |

මූලයන්: රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (වගකීම) පනත හා සංශෝධන

ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

1. **ප්‍රාථමික වියදම් සීමාව**

රජයේ ප්‍රාථමික වියදම අදාළ මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත නාමික ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13 නොඉක්මවිය යුතු ය. ප්‍රාථමික වියදම් සීමාව මුදල් අමාත්‍යාංශය විසින් පුරෝකථනය කරන ලද නාමික ද.දේ.නි. අනුව ගණනය කරන ලද නාමික අගයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබයි. එළඹෙන මුදල් වර්ෂය සහ එයට පසු මුදල් වර්ෂ හතර සඳහා මධ්‍ය කාලීන මූල්‍ය රාමුව තුළ දක්වා ඇති ප්‍රාථමික වියදම් සීමාව, ප්‍රාථමික ශේෂ ඉලක්කය සමග අනුකූල විය යුතු ය. තව ද, ප්‍රාථමික වියදම් සීමාව එළඹෙන මුදල් වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය සඳහා අනුගම්‍ය (binding) විය යුතු ය.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට වසර පහක දී හෝ වසර පහකට පසුව ප්‍රාථමික වියදම් සීමාව සමාලෝචනය කළ යුතු අතර, ඉන් පසු සෑම වසර පහකට වරක් ම එය සමාලෝචනය කළ යුතු ය. එසේ ම, ප්‍රාථමික ශේෂ ඉලක්කයට සහ ණය අඩුකිරීමේ අරමුණට අනුකූල ව ප්‍රාථමික වියදම් සීමාව යාවත්කාලීන කළ යුතු ය.

2. **ඇපකර සීමාව**

මුදල් වර්ෂය අවසානයේ දී රජයේ හිඟ ඇපකරවල මුළු එකතුව අදාළ මුදල් වර්ෂයේ සහ ඊට පෙර මුදල් වර්ෂ දෙකෙහි ද.දේ.නි.යෙහි සාමාන්‍ය අගයෙන් සියයට 7.5ක් නොඉක්මවිය යුතු ය. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ක්‍රියාත්මක වීමෙන් පසු ව සෑම වසර පහකට වරක් ම ඇපකර සීමාව සමාලෝචනය කළ යුතු අතර, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ දක්වා ඇති ණය අඩු කිරීමේ අරමුණු සමග අනුකූල වීම සහතික කිරීම සඳහා ඇපකර සීමාව යාවත්කාලීන කළ යුතු ය.

### බැඳීම් සහිත රාජ්‍ය මූල්‍ය නීති (Binding Fiscal Rules)

රාජ්‍ය මූල්‍ය නීති යටතේ පිහිටුවා ගත් ඉලක්ක අත්පත් කර නොගත් අවස්ථාවල දී ඒ සඳහා වගකිව යුතු ආයතන හෝ නිලධාරීන් වගවිය යුතු ය. ඒ අනුව, දණ්ඩනයන් පැනවීම හෝ ව්‍යවස්ථාපිත ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වේ. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව, ඉලක්කවලින් අපගමනය වූ අවස්ථාවල දී ඒ සඳහා හේතු සහ අනුගමනය කළ හැකි පිළියම් මුදල් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුව ද, පැනවිය යුතු දණ්ඩනයන් දක්වා නොමැති බව පෙනී යයි.

කෙසේ වුව ද, ලෝකයේ විවිධ රටවල රාජ්‍ය මූල්‍ය නීති යටතේ පිහිටුවා ගත් ඉලක්ක අත්පත් කර නොගත් අවස්ථාවල දී ඒ සඳහා හේතු දක්වමින් පාර්ලිමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීමේ සිට දණ්ඩන පැනවීම දක්වා බැඳීම් සහිත රාජ්‍ය මූල්‍ය නීති දැකිය හැකි ය. එවැනි නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

**චෙක් ජනරජය:** මහ නගර සභා වලට පනවා ඇති ණය සීමාව ඉක්මවා ගියහොත් මහ නගර සභා විසින් එම ණය වලින් කොටසක් පියවීමට කටයුතු කළ යුතු ය.

**නෙදර්ලන්තය:** ඉලක්කගත රාජ්‍ය වියදමට වඩා පුරෝකථනය කළ රාජ්‍ය වියදම් ඉහළ අගයක් ගැනීමට ඉඩ ඇතැයි පෙනී යන්නේ නම් මුදල් අමාත්‍යවරයා එය නිවැරදි කිරීමේ සැලැස්මක් ඉදිරිපත් කළ යුතු ය.

## රාජ්‍ය මූල්‍ය නීති සඳහා බැහැරවීමේ වගන්ති (Escape Clauses)

ස්වාභාවික ව්‍යසන, ආර්ථික අවපාත වැනි අනපේක්ෂිත අවස්ථාවල දී රාජ්‍ය මූල්‍ය නීති මගින් නියම කෙරෙන ඉලක්ක අත්පත් කර ගැනීම දුෂ්කර විය හැකි ය. එම නිසා, එවැනි අනපේක්ෂිත අවස්ථාවල දී රාජ්‍ය මූල්‍ය අධිකාරීන්ට එම අනපේක්ෂිත අවස්ථාවලට මුහුණ දීම සඳහා යම් අවකාශ ලබාදීමට රාජ්‍ය මූල්‍ය නීතිවලින් බැහැරවීමේ වගන්ති ඇතුළත් කිරීමට විචක්ෂණශීලී විය යුතු ය. විවිධ රටවල් විසින් භාවිත කරන එවැනි බැහැරවීමේ වගන්ති කිහිපයක් පහත දැක්වේ.

**කොලොම්බියාව:** රටෙහි සාර්ව ආර්ථික ස්ථායීතාවට තර්ජනයක් වන අති විශේෂ අවස්ථාවල දී මුදල් අමාත්‍යාංශයේ ප්‍රධානත්වය දරන අභ්‍යන්තර රාජ්‍ය මූල්‍ය සභාවේ අනුමැතියට යටත් ව රාජ්‍ය මූල්‍ය නීති ක්‍රියාත්මක කිරීම තාවකාලික ව නතර කළ හැකි ය.

**ඉක්වදෝරය:** පුරෝකථනය කළ වාර්ෂික ආර්ථික වර්ධනය, දිගු කාලීන ආර්ථික වර්ධනයට වඩා සියයට 2කින් අඩු නම් සහ සෘණ නිමවුම් පරතරයක් අපේක්ෂා කරන්නේ නම්, ප්‍රාථමික වියදමේ නාමික වාර්ෂික වර්ධනය තවත් සියයට 1කින් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස) ඉහළ නැංවිය හැකි ය.

**ජැමෙයිකාව:** ජාතික ආරක්ෂාව, ජාතික ආපදා හෝ එවැනි අති විශේෂ අවස්ථාවල දී ඒ වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය නීති වලින් බැහැරව කටයුතු කිරීමට මුදල් අමාත්‍යවරයාට හැකියාව ඇත. ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු ය.

## ශ්‍රී ලංකාවේ ප්‍රාථමික වියදම් සීමාවෙන් බැහැර ව ක්‍රියා කිරීම

ජාතික ආරක්ෂාවට, ජාතික ආර්ථිකයේ ආරක්ෂාවට හෝ මහජන සෞඛ්‍යයට සහ ආරක්ෂාවට සැළකිය යුතු තර්ජනයක් සිදු කළ හැකි අනපේක්ෂිත සිදුවීම්වල දී හෝ ස්වාභාවික අපදාවක දී පමණක් අසම්භාව්‍ය බැරකම් සඳහා අයවැය ලේඛනයේ ඇතුළත් කර ඇති සීමාවට වඩා වැඩි මුදලක් අතිරේක, තාවකාලික සහ හඳුනාගත් වියදම් වෙනුවෙන් රජයට වියදම් දැරීමට සිදුවන අවස්ථාවල දී මධ්‍ය කාලීන මූල්‍ය රාමුවේ නිශ්චිත ව දක්වා ඇති ප්‍රාථමික වියදම් සීමාව ඉක්මවා ක්‍රියා කිරීමට රජයට හැකියාව ඇත. එවැනි අවස්ථාවක් පැන නැගුනහොත් හෝ පැන නැගීමට ඉඩ ඇති අවස්ථාවක දී, මුදල් අමාත්‍යවරයා විසින් යෝජනා සම්මතයක් මගින් ප්‍රාථමික වියදම් සීමාවෙන් බැහැර ව ක්‍රියා කිරීමට සහ මධ්‍ය කාලීන මූල්‍ය රාමුවේ දක්වා ඇති ප්‍රාථමික වියදම් සීමාව ඉක්මවා කටයුතු කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉල්ලා සිටිය යුතු ය. එහි දී පහත ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු අතර එම ලේඛන මුදල් අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කළ යුතු ය.

- ප්‍රාථමික වියදම් සීමාවෙන් බැහැර ව ක්‍රියා කිරීමට හේතු වූ කරුණු සාධාරණීකරණය කිරීමක් සහ උපකාරක දත්ත ඇතුළු ව එවැනි බැහැරවීමක අවශ්‍යතාව පැන නැගීමට හේතු වූ කරුණු පැහැදිලි කරනු ලබන ප්‍රකාශයක්.
- ප්‍රාථමික වියදම් සීමාවට නැවත අනුගත වීම සඳහා වන අතිරික්ත වියදම් සහ මුදල් අමාත්‍යවරයා විසින් ගනු ලැබීමට නියමිත ක්‍රියාමාර්ග සහ එම නැවත අනුගත වීමට ගතවන කාල සීමාව ඇතුලුව, අනපේක්ෂිත අවස්ථා කළමනාකරණය කිරීම සඳහා වන තොරතුරු සහ යොදා ගැනීමට නියමිත ඉලක්කගත ක්‍රියාමාර්ගවලින් සමන්විත ප්‍රතිසාධන සැලැස්මක් (recovery plan).
- පරිපූරක ඇස්තමේන්තු යෝජනාවක්.
- යාවත්කාලීන කරන ලද මධ්‍ය කාලීන මූල්‍ය රාමුවක්.

මූලාශ්‍ර


1. වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුව (2018). විශේෂ සටහන 6: රාජ්‍ය මූල්‍ය නීති'. වාර්ෂික වාර්තාව 2017. කොළඹ: ශ්‍රී ලංකා මහ බැංකුව.
2. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත.

3. 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත.

4. 2016 අංක 13 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත.

5. 2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත.

6. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත.

7. Caselli, F.et al. (2018) Second Generation Fiscal Rules: Balancing Simplicity, Flexibility and Enforceability. IMF Staff Discussion Note April 2018.

8. Davoodi, H.R. et al (2012) Fiscal Rules and Fiscal Councils: Recent Trends and Performance during the COVID-19 Pandemic. WP/22/11. International Monetary Fund.

9. European Commission, Directorate General for Economic and Financial Affairs (2023) 'Numerical Fiscal Rules Database'. Available at: https://view.officeapps.live.com/op/view.aspx?src=https%3A%2F%2Feconomy-finance.ec.europa.eu%2Fdocument%2Fdownload%2F57a58927-0240-4bc2-8686-f2c8cb50bf19_en%3Ffilename%3DNumerical%2520Fiscal%2520Rules%2520database%2520-%25202023%2520update_0.xlsx&wdOrigin=BROWSELINK (Accessed 26 September 2024).

10. International Monetary Fund, Fiscal Affairs Department (2022) ' Fiscal Rules Dataset 1985-2021'. Available at: https://www.imf.org/external/datamapper/fiscalrules/matrix/matrix.htm (Accessed 26 September 2024).

11. International Monetary Fund (2018) Sri Lanka: Selected Issues. IMF Country Report No. 18/176. Washington D.C.: International Monetary Fund.

12. International Monetary Fund (2023) Request for an Extended Arrangement under the Extended Fund Facility- Press Release; Staff Report; and Statement by the Executive Director for Sri Lanka. Washington, D.C.: International Monetary Fund.

13. Lledo, V. et al (2017) Fiscal Rules at a Glance. International Monetary Fund.

14. Schaechter, A. et al (2012) Fiscal Rules in Response to the Crisis – Toward the "Next Generation“ Rules. A new Dataset. WP/12/187. International Monetary Fund.

සංවාද සටහන 01

# ඔබගේ සේසත ම නැති කර ගන්නේ ඇයි?

## නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ

*වර්තමානයේ බොහෝ දෙනෙකු තමන් සතු මුදල්මය වත්කම් වැඩි කර ගැනීමේ අරමුණින් වැඩි පොලියක් හෝ වෙනත් ප්‍රතිලාභ ලබා දෙනවා යයි කියන ආයතනවල තැන්පත් කරනවා. ඒ සමහර ආයතන වංචනික ලෙස ගනුදෙනුකරුවන්ගේ මුදල් එකතු කර ගැනීමේ අරමුණින් පවත්වාගෙන යන අනවසර සමාගම් විය හැකියි. එබඳු ගනුදෙනුවල අවසානය වන්නේ තමන් මහන්සියෙන් උපයාගත් මුදල අහිමි වීම පමණයි. ඒ පිළිබඳ ව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති කේ. ජී. පී. සිරිකුමාර මහතා සමග කළ සාකච්ඡාවකි මේ.*

**අපි කැමතියි දැන ගන්න පුරවැසියෙක් විදිහට මූල්‍ය ගනුදෙනුවක් සිද්ධ කරන්න යන කොට කොහොමද ඒ මූල්‍ය ගනුදෙනුව නීත්‍යනුකූල එකක් ද නැත්නම් නීත්‍යනුකූල නොවන එකක් ද කියන කාරණය වෙන් කර හඳුනා ගන්නේ?**

මූල්‍ය ගනුදෙනුවක නීත්‍යානුකූලභාවය හෝ නීතිවිරෝධීභාවය කියන්නෙ අපි එදිනෙදා ජීවිතයේ අත්දකින වෙන බොහෝ දේවල් වගේ ම තමයි. සමහර වෙලාවට මේවායේ තියෙන්නෙ ඉතා ම සියුම් වෙනසක්. ඒක දැනගන්න එක බොහෝ විට නීතිය පිළිබඳ මනා දැනුමකින් තොර කෙනෙකුට පහසු කාරණයක් නෙවෙයි. නමුත්, ඉතා ම සරල මගපෙන්වීමක් ලෙස අපිට කියන්න පුළුවන් මුදල් ගනුදෙනු සඳහා නීත්‍යානුකූල ව පිළිගත්, අනුමැතියලත් ආයතන මොනවද කියන එක සම්බන්ධයෙන් අදහසක් ගන්න නම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී මූල්‍ය ආයතන සහ මූල්‍ය උපකරණ මොනවාද කියන එක ගැන මහජනතාව මුලින් ම දැනගත යුතුයි කියන එක. එහෙම නොවෙන යම්කිසි දේවල් අපේ සමාජයේ තිබුණා වුණත්, ඒවායේ බොහෝ නීති විරෝධීභාවයන් තිබෙන්න පුළුවන්. ඒ නීතිවිරෝධීභාවය නිසා ඔබට ඔබේ මුදලුත් නැතිවෙලා සමහර විට දඬුවමක් වශයෙන් හිරේ විලංගුවේ වැටෙන තත්ත්වයට පවා පත්වෙන්නත් පුළුවන්. අන්න ඒ අවදානම පෙන්නලා හැම තිස්සෙ ම විධිමත් මූල්‍ය ආයතනවලට, විධිමත් මූල්‍ය උපකරණවලට යොමු වෙන්න කියන පණිවුඩය අපි දෙනවා.

**ඒ විදිහට හඳුන ගත්ත අනවසර මුදල් ව්‍යාපාරවල මුදල් යෙදවීම, ඒවා පවත්වා ගෙන යෑම කොහොමද වරදක් වෙන්නෙ? ඒ සම්බන්ධයෙන් බලපැවැත්වෙන යම්කිසි නීතිමය රාමුවක් තියෙනව ද? අපි කැමතියි**

**ඒ පිළිබඳ ව පොඩි පැහැදිලි කිරීමක් ඔබතුමාගෙන් දැනගන්න.**

ඒ සම්බන්ධයෙන් පැහැදිලි නීතිමය රාමුවක් තියෙනවා. ඒක ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නියාමනයට ලක්වන පනත් කිහිපයක් හරහා සිද්ධ වෙනවා. මූලික වශයෙන් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බැංකු ව්‍යාපාර කටයුතු කරන්න පුළුවන්කම තියෙන්නෙ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට. ඒ වගේ ම, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලටත් යම්කිසි ව්‍යාපාර කටයුත්තක යෙදෙන්න පුළුවන්. මේ දෙවර්ගයෙ ම අයට තැන්පතු භාර ගැනීමේ හැකියාවක් තියෙනවා. මීට අමතර ව, මේ මාතෘකාව ඉතා තදින් ම කතා වෙන තැන තමයි 2011 මුදල් ව්‍යාපාර පනත. මේ පනත යටතේ නිශ්චිත ව කියලා තියෙනවා එම පනත යටතේ මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගත් කෙනෙකුට මිසක, වෙන කිසිදු තැනැත්තෙකුට මුදල් තැන්පතු භාර ගැනීමේ හෝ මුදල් ව්‍යාපාර පවත්වා ගෙන යෑමේ හැකියාවක් නැති බව. මෙතනට යම් ව්‍යතිරේක කිහිපයක් තියෙනවා. ඒ කිහිපය හැරුණහම සාමාන්‍යයෙන් කෙනෙකුට මුදල් තැන්පතු භාර ගැනීමක් කරන්න බැහැ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගත්ත බලපත්‍රයකින් තොර ව. එහෙම බලපත්‍රයක් ලබා ගත්ත ආයතනයක් ලෙස හඳුන්වන්නේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් විදිහට. එතන තමයි මම හිතන්නෙ නීතියේ තියෙන නිර්ණායකය ක්‍රියාත්මක වන තැන.

**ඔබ ඉදිරිපත් කළ කරුණු අපට පැහැදිලි යි. ඉතින් හැමෝට ම තියෙන ප්‍රශ්නයක් තමයි මේ අනවසර මූල්‍ය ගනුදෙනු පවතින ස්වරූප මොනවද කියන එක. ඒ ගැන පැහැදිලි කිරීමක් කළොත්?**

මෙතනත් ආයෙමත් මට කියන්න තියෙන්නෙ නීත්‍යනුකූල දෙයක නම්, අවසරය තියෙන දෙයක නම්, ස්වරූපය මෙන්න මේකයි කියන එක අපිට නිශ්චිත ව කියන්න පුළුවන්. නමුත් නීති විරෝධී දේවල් කරන අය ස්වරූපය ගැන හෝ ඒකෙ හැඩය ගැන සැලකිල්ලක් නැහැ. ඒ අය කරන්න පුළුවන් හැමදේම කරනවා, තමන්ගේ නීති විරෝධී අරමුණු ඉෂ්ඨ කරගන්න. වෙනත් කෙනෙක් ගොදුරු කරගෙන, වෙනත් කෙනෙක් බිල්ලට අරගෙන තමන්ගේ මූල්‍ය ලාභය උපරිම කරගන්න. ඒ නිසා යම් යම් ගැටලු තිබුණත් මූලික වශයෙන් මට කියන්න තියෙන්නෙ යම් කිසි කෙනෙක් මුදල් තැන්පතුවක් භාර ගන්නවා නම් ව්‍යාපාර කටයුත්තක් විදිහට පොලී සහිත ව හෝ රහිත ව නැවත ගෙවීමේ පොරොන්දුවක් සහිත ව, යම් යම් ව්‍යතිරේඛයන් යටතේ ආවරණය වෙනවා නම් මිසක, ඒක මුදල් තැන්පතු භාර ගැනීමක්. එතකොට අපි දන්නවා ලංකාවේ විවිධ කාලවල විවිධ තැන්වල වරින් වර මතු වෙනවා මේ වගේ ආයතන සහ සමාගම්, විවිධ යෝජනා ක්‍රම. ඒ අය ඔබට පොරොන්දු වෙනවා විශාල පොලියක් ගෙවනවා කියලා. වාරික වශයෙන් පොලී ගෙවනවා කියලා. එක පාර ලොකු ගාණක් ගෙවනවා කියලා. සමහර වෙලාවට 'මුදල් තැන්පතු නෙමෙයි මේවා', මේවා ආයෝජන ව්‍යාපාර කියලා කියාගෙන එනවා. ගස් වවන්න කතා කරනවා. සමහර වෙලාවට රත්‍රන් වගේ වටිනා ලෝහ ගැන ආයෝජනය කරන්න කතා කරනවා. ශෙයාර් මාකට් එකේ ඉන්වෙස්ට් කරනවා කියලා වෙන විදියකට කරනවා. රක්ෂණ ඔප්පු කියලා කරනවා. මේ කුමන දෙයකින් කරත් නියමාකාරයේ ගනුදෙනුවක් නොවෙන නීති විරෝධී මූල්‍ය තැන්පතු භාර ගැනීමක් විදියට ඒක හඳුනාගන්න පුළුවන් නම්, අන්න ඒක වරදක් වෙනවා. ඒ වගේ තැන්වල තමයි මහ බැංකුව මැදිහත්වීමක් කරන්නෙ.

**අපි මහජනතාවට කොයි තරම් මේ පැහැදිලි කිරීම්, දැනුවත් කිරීම් කළත් මහජනතාව දිගින් දිගට ම මේ අනවසර තැන්පතු සඳහා යොමු වීම වැඩිවෙලා තියෙනවා. ඇත්තට ම මහජනතාව මේ අවිධිමත් මූල්‍ය පද්ධතියට එකතු වෙන්න විශේෂ හේතු කාරණා බලපාලා තියෙනවාද?**

මිනිස්සු ඉතිහාසයේ ඉඳලා ම බොහෝවිට නීති විරෝධී වැඩවලට ඇලුම් කරන කාරණා කිහිපයක් තියෙනවා වෙන්න පුළුවන්. හරි අමාරුයි මේක නිශ්චය කරලා කියන්න. නමුත් එක මූලික ම හේතුවක් තමයි ස්වභාවයෙන් අපි දකින දෙයක් තමයි මිනිස්සු වැඩි ලාභයක් ගන්න වැඩි ප්‍රයෝජනයක් ගන්න තියෙන ස්වභාවික නැඹුරු ව. එතන දී සමහර අය අනවශ්‍ය අවදානමක් ගන්න යනවා. ඒක අපිට සරල ව කියන්න පුළුවන් එක්තරා විදියක කෑදරකමක් කියලා. ඒක නිසාත් අමාරුවේ වැටෙනවා. මේකට බලපාන ලොකු ම හේතුව තමයි මේ වගේ දේවල් සම්බන්ධ ව වන අයට නීතිය සම්බන්ධ ව තියෙන නොදැනුවත්කම. නමුත් අපි දන්නවා නීතියේ ම තියෙන සිද්ධාන්තයක් තමයි නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් නෙවෙයි කියලා. ඒ නිසා කාටවත් කියන්න බෑ මම දන්නෙ නැතුවයි මේ වැඩේ කළේ කියලා. දන්නෙ

නැතිව වුණත් ඒ වගේ දේවල් කරන්න එපා. ගොදුරු වෙන්න එපා කියන පණිවුඩය අපි නිතර ම දෙනවා.

**ඔබ පැහැදිලි කළ ආකාරයට නොයෙකුත් හේතු කාරණා නිසා මහජනතාව මේ අවිධිමත් මූල්‍ය ගනුදෙනුවලට යොමු වෙලා තියෙනවා. එතකොට අපිට දැනගන්න පුළුවන් ද මේ මහජනතාව මේ අනවසර තැන්පතු සඳහා යොමු වීමේ අවදානම කොයි වගේ ද කියලා.**



මේ අවදානම තියෙන්නෙ බොහෝ නීති විරෝධී ආයතන තැන්පතු භාර ගැනීම කරන්නෙ ඉතා ආකර්ෂණීය දේවල් කියලා. ඔවුන්ට බලාපොරොත්තුවක් දෙනවා. අනාගතය පිළිබඳ අපේක්ෂාවක් දෙනවා අපි ලොකු පොළියක් ගෙවනවා. බැංකුවලින් ගෙවනවාට වඩා ගෙවනවා. ඔබ වෙන ආයෝජනයක් කළොත් ලබා ගන්න පුළුවන් ප්‍රතිලාභයට වඩා වැඩි ප්‍රතිලාභයක් අපි දෙනවා. වඩාත් ඉක්මනින් දෙනවා. පහසුවෙන් දෙනවා. ගෙදරට ගෙනත් දෙනවා වගේ බොහොම ආකර්ෂණීය දේවල් එක්ක තමයි එන්නෙ. එහෙම ආවායින් පස්සෙ මිනිස්සුත් කැමතියි නිකන් දෙන දේ, වැඩියෙන් ලැබෙන දේ ගන්න. එතනට ගිහිල්ලා මුලින් මාස දෙක තුනක, සමහර වෙලාවට මේ අයට දැනෙනවා ඇත්ත තමයි බැංකුව දෙනවට වඩා දැන් අපට පොලිය හම්බවෙනවා කියලා. එහෙම හම්බවෙන්නෙ කොහොම ද? සාමාන්‍යයෙන් සමාජයක සාධාරණ ආයෝජන අවස්ථා යටතේ ගෙවන්න පුළුවන් පොළී අනුපාතයන් තියෙනවා. එහෙම එකක් ඉක්මවා ගෙවනවා කියන්නෙ ම මිනිස්සු පරිස්සම් වෙන්න ඕන. මෙතන යම්කිසි දෙයක් සිද්ධ වෙනවා. මොකක්ද බොහෝ විට සිද්ධ වෙන්නෙ මේ වගේ යෝජනා ක්‍රම වල? අර විදියට ලොකු පොළියක් ගෙවන කොට අලුත් අය එකතු වෙමින් ඒ අයගේ මුදල් තැන්පතු කරනවා. ඒ තැන්පතු කරන ඒවා පාවිච්චි කරලා අර මුලින් තැන්පත් කරපු අයට පොළී ගෙවන්න මේ වගේ වංචනිකයන් කුඨ ව්‍යාපාරිකයින් කටයුතු කරනවා. එතකොට බලන් ඉන්න අයට පේන්නෙ මේ අයට ඇත්තට ම ලොකු පොළියක් ගෙවනවා කියලා. ඒ වෙනකොට වෙන්නෙ මොකද තවත් අලුතෙන් අය මෙතනට එකතු වෙවී වැඩිපුර මේ ආයතනවලට සල්ලි දානවා. යම් මොහොතක් එනවා මේ විදියට හැමදාම පොලී ගෙවන්න බෑ. ඒක තමයි සාමාන්‍ය තත්ත්වය. ඒක තමයි තර්කානුකූල තත්ත්වය. එදාට මේ ව්‍යාපාර කඩා වැටෙනවා. බොහෝ විට වෙන්නෙ අර ව්‍යාපාරිකයා පැනලා යනවා. ඉතින් ඒ වගේ තත්ත්වෙකට පත්වෙලා අසරණ වෙන්න එපා කියන එකයි අපි මහජනතාවට කියන්නෙ. නීතියෙන් ඔබට පිළිසරණක් වීම එතන දි හරිම අමාරුයි, එහෙම සල්ලි නැති කරගත්ත කෙනෙකුට පිළිසරණක් ලබා ගන්න යම් තත්ත්වයන් යටතේ අධිකරණවලින් නියෝග කරන්න ඉඩ තියෙනවා තැන්පතු භාරගත්ත අයට නැවත ඒ මුදල් ගෙවන්න කියලා. නමුත් ඒක ප්‍රායෝගික ව බලාපොරොත්තු වෙන්න එපා. මොකද මේ අය වංචනිකයෝ. වංචනිකයෙක් ඔබේ වංචා කරගත්ත මුදල් තියාගෙන තවදුරටත් ඔබ අවට ගැවසෙන එකක් නැහැ.

**ඔව්, මහජනතාවටත් යම්කිසි වගකීමක් තියෙනවා මේ තමන් සතුවන වටිනා මුදල් අනාරක්ෂිත විදියට මේ අනවසර තැන්පතුවල යොදවන්නෙ නැතුව ආරක්ෂාකාරී ලෙස ආයෝජනය කිරීමට. ඇත්තට ම මහජනතාවගේ මුදල් භාර ගැනීමට අවසර තියෙන්නෙ කාට ද?**

අපි පැහැදිලි ව ම ගත්තොතින් බැංකු පනත යටතේ බලපත්‍රලාභී ආයතන දෙවර්ගයක් තියෙනවා. මූලික වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු. ඒ වගේ ම බලපත්‍රලාභී විශේෂිත බැංකු. මේ ආයතන දෙවර්ගයට බැංකු පනත යටතේ අවසර තියෙනවා මහජනතාවගේ මුදල් තැන්පතු භාරගන්න. ඊට අමතර ව, මූලික වශයෙන් ම තියෙන්නෙ මූල්‍ය සමාගම්. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ලියාපදිංචි වෙලා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගත්ත සමාගමකට තැන්පතු භාර ගැනීමේ හැකියාවක් තියෙනවා. මේවා තමයි සාමාන්‍යයෙන් විධිමත් ව අවසරය තියෙන ආයතන වශයෙන් හඳුනා ගන්න පුළුවන්. ඊට අමතර ව, යම් යම් අවස්ථාවන්ට යටත් ව, සමුපකාර සමිති වගේ ඒවාට එක්තරා සීමිත බලයක් තියෙනවා. ඒ ඇරුණහම සාමාන්‍යයෙන් අපිට කියන්න පුළුවන් මහ බැංකුව යටතේ පවතින වාණිජ බැංකු, විශේෂිත බැංකු

සහ මුදල් සමාගම් තමයි මේ බලය දරන ආයතන වෙන්නෙ.

**දැන් සමාජය තුළ වැඩිපුර කතාබහට ලක්වන කාරණයක් තමයි ශ්‍රී ලංකා මහ බැංකුව මෙම අනවසර මූල්‍ය ආයතන සම්බන්ධයෙන් කටයුතු කරන්නෙ කොහොමද කියන කාරණය. මේ හා සම්බන්ධ යම් නීතිමය රාමුවක් තියෙනව ද? ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කළොත්.**

> විශේෂයෙන් ම අපි මතක තියාගන්න ඕන දේ තමයි ශ්‍රී ලංකා මහ බැංකුව කියන්නෙ රටේ ප්‍රමුඛත ම මූල්‍ය පරිපාලනය සිදු කරන ආයතනය මිස ක, ශ්‍රී ලංකා මහ බැංකුව කොයි වෙලාවකවත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක්, Law Enforcement Agency එකක්, පොලීසිය වගේ එකක් නෙවෙයි.

ඔව්, ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධයෙන් මේ කතාබහ තියෙනවා. සමහර වෙලාවට අපි විවේචනයට ලක් වෙනවා. සමහර වෙලාවට මිනිස්සු උද්ඝෝෂණය කරනවා මහ බැංකුව ඉස්සරහට ඇවිල්ලා කෝ අපේ සල්ලි දෙන්න කියලා. මම නැවත කියන්නෙ කලින් කිව්ව විදියට ම මහ බැංකුවට මේ සම්බන්ධයෙන් බලතල තියෙන්නෙ යම්කිසි නිශ්චිත පනත්වලින්. මම කලින් කිව්වා විශේෂයෙන් ම මුදල් ව්‍යාපාර පනත යටතේ. මහ බැංකුව විසින් යම් යම් පරීක්ෂණ කරලා නිර්ණය කරනවා පාලක මණ්ඩලය විසින් යම්කිසි ආයතනයක් පවත්වා ගෙන යන්නෙ මුදල් ව්‍යාපාරයක් ද එය තැන්පතු භාර ගැනීමක් සිද්ධ කරනවා ද කියලා. එහෙම නිර්ණය කිරීමක් කළා ම ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනවා ඒ වගේ තැන්පතු භාර ගැනීම් කරපු අයට විරුද්ධ නඩු පවරලා ඉදිරියට කටයුතු කර ගෙන යන්න. එහෙම උසාවිවල නඩු පවරලා ඒ අය වැරදිකාරයෝ කරලා දඩ සහ වෙනත් දඬුවම් නියම කරලා තියෙනවා අධිකරණ හරහා. විශේෂයෙන් ම අපි මතක තියාගන්න ඕන දේ තමයි ශ්‍රී ලංකා මහ බැංකුව කියන්නෙ රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධානම පරිපාලන ආයතනය මිසක, ශ්‍රී ලංකා මහ බැංකුව කොයි වෙලාවකවත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක්, (Law Enforcement Agency) එකක්, පොලීසිය වගේ එකක් නෙවෙයි. ඒ නිසා අපි කරන කටයුත්ත ඉතා පැහැදිලි ව මිනිස්සුන්ට කියන්න ඕනෙ. අපි කරන්නෙ අර වගේ දේවල් විමර්ශනය කරලා අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට බාර දෙන එක. අපි ඊට අමතර ව කරන දේ තමයි මෙවැනි දේවල්වලට අහුවෙන්න එපා කියන දැනුවත් කිරීම දැඩි සේ අඛණ්ඩ ව වරින් වර අපි කරගෙන යනවා. අවාසනාව තමයි ඒ කොච්චර කළත් තවමත් යම් පිරිසක් මේවාට ගොදුරු වීම. අපි තවදුරටත් අධෛර්යයට පත් නොවී මේ දැනුවත් කිරීම දිගින් දිගටම කරනවා මොන මුවාවෙන් කරත්, තැන්පතු භාර ගැනීමක් නම් කරන්නෙ. අපි ඒක නීතිවිරෝධී බව මහජනතාවට පැහැදිලි කරනවා. ඒක අහන්නේ නැතුව තැන්පතු භාර ගන්න අය ඉන්නවා නම් නීතිය හමුවට පමුණුවන්නත් කටයුතු කරනවා. නීති විරෝධී තැන්පතු භාර ගන්න කෙනෙක් ළඟ, නීති විරෝධී මුදල් ව්‍යාපාර කරන කෙනෙක් ළඟ සල්ලි තැන්පත් කරලා ඔබේ සල්ලි අතුරුදහන් වුණාම ඒ පුද්ගලයා අතුරුදහන් වෙනවාත් එක්ක ම ඔබට මහ බැංකුවෙන් සල්ලි ඉලන්න බෑ. මොකද ඔබ කරලා තියෙන්නෙ නීති විරෝධී වැඩකටයුත්තකට අනුබල දීමක්. ඉතින් කොහොමද මහ බැංකුව හෝ රජය ඔබේ මුදල් නැවත ලබා දෙන්නෙ? ඒක කරන්න බෑ. ඒක කෙරෙන්නෙ නෑ. හැබැයි ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට සහ අධීක්ෂණයට ලක්වෙන විධිමත් මූල්‍ය ආයතනයක නම්, ඒ කියන්නෙ බලපත්‍රලාභී වාණිජ බැංකුවක, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක හෝ බලපත්‍රලාභී මුදල් සමාගමක නම් ඔබ මුදල් තැන්පත් කළේ, ඒ අය සියලුදෙනා ම ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන නිසා. එක පුද්ගලයෙකුට එක බැංකුවක තියෙන තැන්පතුවලින් රුපියල් ලක්ෂ එකොළහක් දක්වා ප්‍රමාණයකට රක්ෂණාවරණයක් පවතිනවා. යම් හෙයකින් මේ විධිමත් ආයතනයකින්, ඒ කියන්නෙ බැංකුවක හෝ මුදල් සමාගමක යම් ප්‍රශ්නයක් නිසා ඔබේ තැන්පතු නොලැබී යන තත්ත්වයක් තියෙනවා නම්, ලක්ෂ 11ක් දක්වා වන්දියක් ඔබට දැනට ලබා ගන්න පුළුවන්. ඒ වාසිය තියෙන්නෙ මෙන්න මේ විධිමත් ක්‍රමයේ ඉන්න තැන්පත්කරුවන්ට මිසක, අර තැනින් තැන මතු වෙන වැඩි ලාභ, වැඩි ප්‍රතිලාභ දෙනවා යැයි කියන ව්‍යාජ ව්‍යාපාරවල තැන්පතු කරන අයට නෙමෙයි.

**අවසාන වශයෙන් මහජනතාවට මේ අනවසර තැන්පතු සම්බන්ධ ව තියෙන වගකීම මොන වගේ ද?**

මහජනතාවට පැහැදිලි වගකීමක් තියෙනවා. ඒ වගකීම මම මුලින්ම කිව්වා වගේ අර නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් නොවන නිසා මේ සම්බන්ධ ව නීතියත්, ප්‍රායෝගික ව එය සිද්ධ වෙන්නෙ කොහොමද කියන එකත් තේරුම් ගන්න. ඒ වගේම යම් කිසි ආකාරයක මූල්‍ය සාක්ෂරතාවයකුත්, මූල්‍ය විනයකුත් අවශ්‍යතාව අපි හැමතිස්සේ ම අපේක්ෂා කරනවා. මිනිස්සු යම් යම් විෂය ක්ෂේත්‍රවල පරිණත වෙන්න පුළුවන්. ප්‍රවීණයන් වෙන්න පුළුවන්. ප්‍රවීණ වෛද්‍යවරයෙක් වෙන්න පුළුවන්. ඉතාම පරිණත අත්දැකීම් බහුල ඉංජිනේරුවෙක් වෙන්න පුළුවන්. නමුත්, මූල්‍ය ක්ෂේත්‍රයට එනකොට ඔබ තැන්පතු භාර දෙන්නෙ වංචනිකයෙකුට නම්, ඔබේ වෙනත් ක්ෂේත්‍රයක තියෙන පරිණත බවින් තේරුමක් නැහැ. ඒ නිසා අපි කියන්නෙ ඕනෑම කෙනෙකුට වැරදි සිද්ධ වෙන්න පුළුවන්. ඒ වැරදි අවම කර ගන්න නම් කරන්න ඕන ඒ පිළිබඳ නිසි දැනුම ලබා ගන්න. නිසි අවබෝධය ලබා ගන්න. ප්‍රශ්නයක් තියෙනවා නම් ප්‍රශ්න විසඳා ගන්න ඔබ දන්න කියන කෙනෙකුගෙන්. ඔබ ශ්‍රී ලංකා මහ බැංකුවට කතා කළොත් මම හිතන්නෙ ඔබට මේ කාරණා පිළිබඳ හොඳ පැහැදිලි කිරීමක් ගන්න පුළුවන්. එතකොට මේ අනවශ්‍ය උගුල්වල වැටෙන එකෙන් වළකින්නත් හැකියාව තියෙනවා.

අපි හිතනවා අනවසර මූල්‍ය තැන්පතු කියන්නෙ මොනවාද, මේවායේ අවදානම කොයි වගේ ද, පවතින ස්වරූප මොනවාද, යම් අවබෝධයක් ඒ වගේ ම ඔබගේ ආයෝජන කොහොම ද ආරක්ෂිත ලෙස ආයෝජනය කරන්න ඕනේ කියන කාරණාව සම්බන්ධ ව. ඒ වගේ ම ශ්‍රී ලංකා මහ බැංකුව කොහොමද මේ අනවසර මූල්‍ය තැන්පතු සම්බන්ධ ව කටයුතු කරන්නෙ කියන කාරණාවත් ඔබට තවදුරටත් අවබෝධ වෙන්න ඇති කියලා ■.

*සාකච්ඡා කළේ - සමන්තිකා යාපා*
*සහකාර අධ්‍යක්ෂිකා,*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

**අනවසර මූල්‍ය තැන්පතු සම්බන්ධයෙන් යම්කිසි දැනුවත් වීමක් අවශ්‍ය වන්නේ නම් හෝ ගැටලුකාරී තත්ත්වයක් පවතින අවස්ථාවක ඒ පිළිබඳ ව පැමිණිල්ලක් සිදු කිරීම අවශ්‍ය නම් රාජකාරී වේලාවන් හි දී පමණක් අමතන්න.**

**0112 477 000 | කෙටි දුරකථන අංකය 1935**

මෙම සාකච්ඡාව නැරඹීමට පහත QR කේතය Scan කරන්න.





# කෘත්‍රිම බුද්ධිය මඟින් කාර්යාල කටයුතු සිදු කිරීම

# ගැටලු සහගතද?


**ලසිත් ප්‍රනාන්දු**
**ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ**
**තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව**


**හැඳින්වීම**

කෘත්‍රිම බුද්ධිය (AI) යනු මානව බුද්ධිය අවශ්‍ය වන කාර්යයන් ඉටු කිරීමට සමත් පරිගණක පද්ධතියක් ලෙස සරල ව අර්ථ දැක්විය හැකි ය. දෘශ්‍ය සංජානනය, කථන හඳුනාගැනීම, තීරණ ගැනීම සහ ගැටලු විසඳීම වැනි කාර්යයන් මේ අතර ප්‍රමුඛ ස්ථානයක් උසුලයි. AI පද්ධතීන් මානව තර්කන හැකියාවට සමානකම් ලබාගැනීම සඳහා සංකීර්ණ ගණිතමය රාමු, මිනිස් මොළයේ ස්නායු ජාල (Neural Networks) අනුකරණය කරන පද්ධති සහ විශාල දත්ත සමුදායයන් භාවිත කරයි.

AI හී දියුණුව එකවරම සිදු වූවක් නොවන අතර, 20 වන සියවසේ දී ඇතිවූ පරිගණක දෘඩාංගවල සැකසුම් බලයේ වර්ධනය, ඒ වනවිට පරිගණකගත වී තිබුණු සුවිශාල දත්ත ප්‍රමාණය හා දියුණු පරිගණක සූත්‍ර (algorithms) හේතුකොටගෙන ඇති වූ පෙරළියක් ලෙස සඳහන් කළ හැකි ය.

මෑත කාලීන ව, කෘත්‍රිම බුද්ධිය (AI) ආයතනික කාර්යාල පරිසර ඇතුළු විවිධ කර්මාන්ත තුළ වේගවත් පරිවර්තන සිදුකරන තාක්ෂණයක් බවට පත්ව ඇත. AI විසින් මෙහෙයවෙන පාරිභෝගික සේවා, චැට්බොට්, ස්වයංක්‍රීය ලේඛන සැකසීම සහ වැඩි දියුණු කළ දත්ත විශ්ලේෂණ දක්වා AI විසින් කාර්යාලීය කටයුතු ක්‍රියාත්මක වන ආකාරය ඉතා ආකර්ශනීය ලෙස ප්‍රතිනිර්මාණය කරයි. ඒ සමඟ ම, AI යෙදවුම් ක්‍රියාත්මක කිරීමේ දී ආයතන විසින් සලකා බැලිය යුතු අභියෝග සහ අවදානම් රාශියක් ද දක්නට ලැබේ. මේවාට සදාචාරාත්මක ගැටලු, සයිබර් ආරක්ෂණ අවදානම, ශ්‍රම බලකායේ නොගැළපීම්, දත්ත රහස්‍යතාව සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිවල පක්ෂග්‍රාහීත්වය තීව්‍ර කිරීමට AI තාක්ෂණයට ඇති හැකියාව ප්‍රධාන වේ. ඉහත ගැටලු පිළිබඳ ව සවිස්තරාත්මක ව අධ්‍යයනය කරන මෙම ලිපිය, විධිමත් සැලසුම්, පාලක පරීක්ෂණ වැනි උපාය මාර්ග මඟින් එම ගැටලු අවම කරගත හැකි අයුරු පිළිබඳ ව ද සැකෙවින් විග්‍රහ කරයි.

AI යෙදවීමේ දී ඇති විය හැකි සදාචාරාත්මක ගැටලු ආයතනික ලෝකයේ AI වටා බැඳුනු ප්‍රමුඛතම ගැටලුවක් වන්නේ එහි යෙදවීමේ සදාචාරාත්මක භාවයයි. AI පද්ධති බොහෝ විට සේවකයින්ට, පාරිභෝගිකයින්ට සහ ව්‍යාපාරික ප්‍රතිඵලවලට සෘජු ව ම බලපෑම් කළ හැකි තීරණ ගැනීමට භාවිත කරයි. නුසුදුසු හෝ පෙර පරීක්ෂාවට බඳුන් නොවූ ක්ෂේත්‍රයන්හි AI භාවිතය පක්ෂග්‍රාහී ප්‍රතිඵලවලට, සම්මත සදාචාර උල්ලංඝනයට සහ ආයතනික කීර්ති නාමයට හානි කිරීමට හේතු විය හැකි ය.

මයික්‍රොසොෆ්ට් ආයතනය දියත් කළ Tay චැට් බොට් මෙවලම මීට කදිම නිදසුනක් සපයයි. Tay යනු ට්විටර්හි (Twitter or X Platform) මයික්‍රොසොෆ්ට් විසින් දියත් කරන ලද AI චැට්බෝට් එකක් වන අතර එය පරිශීලකයින් සමග කථනයෙන් ඉගෙන ගැනීමට නිර්මාණය කර ඇත. කෙසේ වෙතත්, එය ජාතිවාදී සහ අහිතකර ප්‍රකාශ නිකුත් කිරීම හේතුවෙන් ආයතනික කීර්තියට විශාල හානියක් සිදු විය.

දෘශ්‍ය සජීවීකරණ මාධ්‍යන්හි ඉතා ප්‍රචලිත Deepfake තාක්ෂණය මිනිසුන්ගේ අතිශය තාත්වික ව්‍යාජ වීඩියෝ සහ රූප නිර්මාණය කිරීමට AI භාවිතා කරයි. මෙවැනි උදාහරණ බොහොමයක් විවිධ ක්ෂේත්‍රයන්හි ඇති AI යෙදවුම් ආශ්‍රිත ව දැක ගත හැකි ය.

**AI යෙදවුම්හි සදාචාරය හා බැඳුණු ගැටලුවල මූලයන් මෙලෙස දැක්විය හැකි ය.**

- **AI සූත්‍ර වල පක්ෂග්‍රාහීත්වය**
  AI සූත්‍ර (algorithm) සාමාන්‍යයෙන් අතීත දත්ත මත පුහුණු කර ඇති අතර, පුහුණු කිරීමට යොදා ගත් දත්ත මානව තීරණ මත පදනම් වී තිබේ නම් පද්ධතිය මගින් ලබා දෙන තීරණ තුළ ද පක්ෂග්‍රාහීකම් අඩංගු විය හැකි ය. නිදසුනක් වශයෙන්, කුලියට ගැනීමේ දී භාවිත කරන AI පද්ධතියක් පක්ෂග්‍රාහී දත්ත මත පුහුණු කරනු ලැබුවහොත්, ඇතැම් කණ්ඩායම්වලට නොදැනුවත් ව ම වෙනස්කම් කළ හැකි ය. මෙම ගැටලුව කාර්ය සාධන සමාලෝචන, පාරිභෝගික සහාය සහ කළමනාකරණ කාර්යයන්හි තීරණ ගැනීම වැනි ක්ෂේත්‍රවල ද එලෙස ම සිදුවීමට ඉඩ කඩ ඇත.

- **වගවීම**
  AI පද්ධතියක් තීරණයක් ගන්නා විට, වගවීම පිළිබඳ ප්‍රශ්නය පැන නගී. යම් අනපේක්ෂිත ප්‍රතිඵලයකට වගකිව යුත්තේ AI පද්ධතිය ද, මානව ක්‍රියාකරුවන්ද යන්න තීරණය කිරීමට අපහසු විය හැකි ය. විශේෂයෙන් ම මෙම අපැහැදිලි භාවය, මූල්‍ය, සෞඛ්‍ය සේවා සහ නීතිය වැනි අංශවල අතිශය සංවේදී ප්‍රතිවිපාක ඇති කළ හැකි තීරණ මත සදාචාරාත්මක ප්‍රශ්න මතු කරයි.

- **විනිවිදභාවය සහ විශ්වාසය**
  AI පද්ධතීන්හි තීරණ ගැනීමේ ක්‍රියාවලි පරිශීලකයින්ට විනිවිද නොපෙනේ. පාරදෘශ්‍ය භාවයේ ඌනතාව AI පද්ධති කෙරෙහි ඇති විශ්වාසය ඛාදනය වීමට හේතු විය හැකි ය. විශේෂයෙන් ම පාර්ශ්වකරුවන්ට යම් යම් ප්‍රතිඵල ලැබුනේ කෙසේද යන්න තේරුම් ගත නොහැකි විට මෙම ගැටලුව වඩා තීව්‍ර වේ. උපාය මාර්ගික තීරණ සඳහා කෘත්‍රිම බුද්ධිය මත විශ්වාසය තබන ආයතනික විධායකයින් සඳහා මෙය විශේෂයෙන් අදාළ වේ.

  දත්ත රහස්‍යතා සහ තොරතුරු ආරක්ෂණ ගැටලු කාර්යාලීය පිළිවෙත් තුළ AI ඒකාබද්ධ කිරීම සඳහා බොහෝ විට විශාල දත්ත ප්‍රමාණයක් සැකසීම අවශ්‍ය වේ. මෙලෙස AI පද්ධති පුහුණු කිරීමට සහ එම පද්ධති මගින් විසඳුම් ලබාගැනීමට යොදා ගන්නා දත්තවල රහස්‍ය භාවය හා ආරක්ෂාව එම පද්ධති කෙසේ තහවුරු කරන්නේද යන්න ප්‍රශ්නකාරී වේ. තොරතුරු තාක්ෂණ නියාමනයන්ට බඳුන්වන ආයතන තුළ එම රෙගුලාසිවලට අනුකූලව AI තාක්ෂණය භාවිතා කිරීම තවමත් ගැටලු සහගත ය. මෙම ගැටලු අතර දත්ත කාන්දුවීම් සහ දත්ත පෞද්ගලිකත්වය සම්බන්ධ ගැටලු ප්‍රධාන වේ.

- **දත්ත කාන්දුවීම් (Data Leakage)**
  බොහෝ ආයතන ආයතනික මට්ටමේ AI පද්ධති ස්ථාපිත කොට නොමැති අතර, නොමිලයේ භාවිතයට අවකාශය ඇති පද්ධති තුළට ආයතනික දත්ත ඇතුළත් කිරීම සිදුවේ. එය සංවේදී ආයතනික තොරතුරු, බුද්ධිමය දේපළ සහ පුද්ගලික දත්ත නිරාවරණය කිරීමට මග පාදයි. පහත රූපයේ (Figure 1) පෙන්වා දෙන ChatGPTහි අවවාදාත්මක පණිවුඩය සංවේදී තොරතුරු කාන්දු වීමට ඇති ඉඩ පෙන්වා දෙන එක නිදසුනකි. තවද ක්ලවුඩය (Cloud) මත පදනම් වූ AI පද්ධතිවල පැතිරීම සංකීර්ණත්වයේ තවත් ස්ථරයක් එක් කරයි. බොහෝ AI පද්ධති තම නියමයන් හා රෙගුලාසි




Figure 1: සංවේදී තොරතුරු ඇතුළත් නොකරන ලෙසට ChatGPT යොදා ඇති පණිවුඩය

(Terms and Conditions) තුළ මෙම අවදානම සඳහන් කර තිබුන ද, පරිශීලකයන් විසින් ඒවා අවධානයෙන් යුතුව කියවා පිළිපැදීමක් ප්‍රායෝගික ව සිදු නොවේ.

- **පෞද්ගලිකත්වය සම්බන්ධ ගැටලු (Privacy Concerns)**
  පරිශීලක අනන්‍යතාව ආරක්ෂා කිරීම සඳහා AI පද්ධති දත්ත බොහෝ විට නිර්නාමික කළ ද, තාක්ෂණයේ දියුණුව එම දත්ත නැවත හඳුනා ගැනීමට ඉඩ ලබා නොදෙන්නේ යැයි තහවුරු කළ නොහැකි ය. තව ද ඇතැම් AI යෙදවුම් ඒවා නිර්මාණය කොට ඇති අරමුණු උදෙසා යෙදවීමේ දී පෞද්ගලිකත්වයට හානි පැමිණීම නිතැතින් ම සිදුවේ. සේවක ඵලදායිතාව හෝ පුද්ගල හැසිරීම් නිරීක්ෂණය සඳහා භාවිතා කරන AI මෙවලම් පෞද්ගලිකත්වය සමග දත්ත එකතු කිරීම තුලනය කළ යුතු ය. එයින් ද ඔබ්බට ගිය ඔත්තු බැලීමේ AI යෙදුම් පෞද්ගලිකත්වය ආක්‍රමණය කිරීමට සහ දත්ත අනිසි ලෙස භාවිතා කිරීමට බලධාරීන් හට ඉඩ ලබාදේ. Clearview AI සහ Amazon Rekognition වැනි යෙදවුම් ආරක්ෂක ආයතන විසින් තත් කාලීන ව පුද්ගලයන් හඳුනා ගැනීම සඳහා භාවිත කරයි.

## ශ්‍රම බලකාය කෙරෙහි බලපෑම

AI තාක්ෂණය කාර්යක්ෂමතා වර්ධනය, මෙහෙයුම් වියදම් අවම කිරීම වැනි වාසි අත්කර දුන්න ද, ශ්‍රම බලකාය සහ සාම්ප්‍රදායික රැකියා කෙරෙහි ඍජු ව ම බලපෑම් ඇති කරයි. AI විසින් ඇතැම් රැකියා සඳහා පුනරාවර්තන හෝ අඩු කුසලතා භූමිකා ආදේශ කිරීම නිරායාසයෙන් ම සිදුවේ. එය තවදුරටත් පහත පරිදි පැහැදිලි කල හැකි ය.

- **සාමාන්‍ය කාර්ය ස්වයංක්‍රීය කිරීම**
  දත්ත ඇතුළත් කිරීම, උපලේඛනගත කිරීම සහ පාරිභෝගික සේවා වැනි සාමාන්‍ය සහ පුනරාවර්තන කාර්ය ස්වයංක්‍රීය කිරීම සඳහා AI වඩාත් යෝග්‍ය සහ ඵලදායී බව නොරහසකි. එමගින් ඉහළ මට්ටමේ කාර්ය කෙරෙහි අවධානය යොමු කිරීමට සේවකයින් නිදහස් කළ හැකි අතර, එය මෙම කාර්ය මත දැඩි ලෙස රඳා පවතින භූමිකාවල අතිරික්තයට ද හේතු වේ. මෙම සංක්‍රාන්ති අවධිය විරැකියාව ඉහළ යාමට සහ ඒ හා බැඳුණු සමාජීය ගැටලුවලට මං පාදයි. මෙලෙස බලපෑමට ලක් වූ සේවකයින් නැවත පුහුණු කිරීම සමාගම්වල වගකීමද නැතහොත් අදාළ සේවකයන්ගේ වගකීමක්ද යන්න ප්‍රශ්නාර්ථයකි.

- **නිපුණතා සංක්‍රාන්තිය**
  AI හි නැගීම සමග ශ්‍රම බලකා කුසලතා නැවත ගැලපීම අත්‍යවශ්‍ය වේ. සේවකයින්ට කළමනාකරණය, පුහුණුව සහ අන්තර්ක්‍රියා ඇතුළත් නව භූමිකා වෙත අනුගත වීමට අවශ්‍ය වනු ඇත. මානව නිර්මාණශීලීත්වය, විචාරාත්මක චින්තනය සහ අන්තර් පුද්ගල කුසලතා අවශ්‍ය වන කාර්යයන් වෙත භූමිකා මාරු විය යුතු ය.

## සයිබර් ආරක්ෂණ අවදානම්

අනෙකුත් සියලු පද්ධති මෙන් ම, AI යෙදවුම් ද සයිබර් ආරක්ෂණ දුර්වලතාවලින් සම්පූර්ණයෙන් ම නිදහස් නොවේ. AI පද්ධති සඳහා අවශ්‍ය අධික බලශක්තිය සහ අනෙකුත් තාක්ෂණික සම්පත්, මෙම පද්ධති මත සමාගම් සහ පරිශීලකයන්ගේ ඇති දැඩි යැපීම වැනි කරුණු නිසා මෙම පද්ධති කෙරෙහි හැකර්වරුන්ගේ අවධානය වැඩිපුර යොමු වේ. එබැවින් සයිබර් ආරක්ෂණය කාර්යාලිය AI යෙදවුම්වල ඉතා වැදගත් කරුණකි. AI පද්ධතිවලට සයිබර් ප්‍රහාර පැමිණිය හැකි ප්‍රධන ආකාර කිහිපයක් පහත පරිදි වේ.

- **පුහුණු දත්ත විකෘති කිරීම (Training Data Poisoning)**
  AI පද්ධති ස්වයං ඉගෙනීම හා පුහුණුව සඳහා භාවිත කරන විශාල දත්ත කට්ටල මත දැඩි ලෙස රඳා පවතී. සයිබර් ප්‍රහාරකයන් විසින් මෙම පුහුණු දත්ත විකෘති කිරීම මගින් පද්ධතිය වැරදි තීරණ ගැනීම සඳහා පොළඹවනු ලබයි. මෙලෙස දත්ත ඇතුළත් කිරීම සඳහා විශේෂිත තාක්ෂණික ඥානය අවශ්‍ය නොවන බැවින් මේ ආකාරයේ ප්‍රහාර ඇති වීමේ සම්භාවිතාව ඉහළ මට්ටම පවතී. ආරක්ෂක කඩවීම් හඳුනා ගැනීමට හෝ මූල්‍ය ගනුදෙනු වැනි සංවේදී ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීමට AI පද්ධති භාවිතා කරන ආයතනික සැකසුම් තුළ මෙම ප්‍රහාර ඉතා ගැටලුකාරී විය හැකි ය.

- **පද්ධති ආකෘතිය උපුටා ගැනීම. (Model Extraction)**
  AI පද්ධතිය තුළ එය නිර්මාණය කොට ඇති ආකෘතිය සහ එහි මූලයන් බොහෝ විට

පරිශීලකයන් හට විවෘත කොට නොමැත. නමුත් සයිබර් ප්‍රහාරකයන් විසින් කූට ලෙස සැකසූ විමසුම් (query) තුළින් එම පද්ධතියේ ආකෘතිය හා බැඳුණු සංවේදී දත්ත පිටපත් කරගැනීම මෙහි දී සිදු කරයි. එමගින් AI ආකෘතියේ අනවසර පිටපත් නිෂ්පාදනය සිදු කරයි.

මෙය බුද්ධිමය දේපළ සොරකම් කිරීමට, පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීමට සහ AI පද්ධති අනිසි ලෙස භාවිතා කිරීමට හේතු විය හැකි ය.

- **අභ්‍යන්තර තර්ජන**
  සංවේදී දත්ත සමග කටයුතු කරන ඕනෑ ම පද්ධතියක් මෙන්, AI පද්ධති ද අභ්‍යන්තර තර්ජනවලට ගොදුරු වේ. පුහුණු දත්ත හෝ ආකෘති වෙත ප්‍රවේශය ඇති සේවකයින්ට හෝ කොන්ත්‍රාත්කරුවන්ට හිතාමතාම ඒවා වෙනස් කිරීමට, ඒවා සොරකම් කිරීමට හෝ AI පද්ධතිය අනිසි ලෙස භාවිත කිරීමට හැකියාව පවතී. මෙය දත්ත කාන්දු වීම, ප්‍රතිඵලවලට හානි කිරීම සහ ආයතනික කීර්ති නාමයට හෝ මෙහෙයුම්වලට හානි වීමට හේතු විය හැකි ය.

## ගැටලු අවම කිරීමේ උපාය මාර්ග

කාර්යාල කටයුතුවල දී AI හා සම්බන්ධ ගැටලු අවම කිරීම සඳහා උපාය මාර්ග කිහිපයක් අනුගමනය කළ හැකි ය.

- **නිසි සැලසුමක් සහිත ව භාවිතය**
  AI යෙදවුම් භාවිතයට ප්‍රථම ආයතන විසින් නිසි අධ්‍යනයක් සිදු කර කුමන අංශ සඳහා AI භාවිතය යෝග්‍යද යන්න තහවුරු කරගැනීම ඉතා ම වැදගත් වේ. නිසි ගුණ නුගුණ විශ්ලේෂණයක් සිදු කොට ආයතනයට සහ පරිශීලකයන්ට වාසිදායක වන පරිදි භාවිතය සීමා කිරීම අත්‍යවශ්‍ය කරුණකි. මෙම ක්‍රියාවලිය හැකි ඉක්මනින් සිදු කිරීම, AI භාවිතය පුළුල්ව ව්‍යාප්ත වූ පසු නියාමනය හා සීමා කිරීමේ දී ඇතිවිය හැකි ප්‍රතිරෝධයන් මග හරවා ගැනීමට උපකාරී වේ.

- **සදාචාරාත්මක AI රාමු සකස් කිරීම**
  සදාචාරාත්මක AI රාමු සකස් කිරීම, ආයතන වගකීමෙන් යුතුව AI යෙදවුම් භාවිතා කිරීම සහතික කිරීමට උපකාරී වේ. මෙම රාමු තුළ විනිවිදභාවය, සාධාරණත්වය, වගවීම සහ අපක්ෂපාතීත්වය ඉහළ නැංවීම සඳහා මාර්ගෝපදේශ ඇතුළත් විය යුතු ය. AI භාවිතය අධීක්ෂණය කිරීමට සහ ප්‍රමිතිවලට අනුකූල වීම සහතික කිරීමට සමාගම්වලට ආචාර ධර්ම මාලාවක් නිර්මාණය කළ හැකි ය.

- **සයිබර් ආරක්ෂාව සඳහා ආයෝජනය**
  AI පද්ධති සයිබර් ආරක්ෂණ තර්ජනවලින් ආරක්ෂා කිරීම සඳහා, දත්ත ගුප්තකේතනය (Data encryption), බහු සාධක සත්‍යාපනය (Multi factor Authentication) සහ විශේෂිත ආරක්ෂක මෙවලම් ඇතුළු ශක්තිමත් ආරක්ෂක පියවර සඳහා ආයෝජනය කළ යුතු ය. නිත්‍ය විගණනය සහ අඛණ්ඩ ව පද්ධති නිරීක්ෂණය කිරීම මගින් සක්‍රීය ව දුර්වලතා හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. තව ද ආයතනයක් සඳහා AI යෙදවුමක් තෝරාගැනීමේ දී එම යෙදවුම කෙතරම් ආරක්ෂිතද යන්න සයිබර් ආරක්ෂණ විශේෂඥයන්ගෙන් හෝ ඒ හා බැඳුණු ස්වාධීන තත්ත්ව සහතික කිරීමේ වාර්තා අධ්‍යයනයකින් තහවුරු කරගත යුතු ය. තව ද, අති බහුතරයක් AI යෙදවුම් අන්තර්ජාතික ක්ලවුඩය මත ස්ථාපනයකොට ඇති බැවින්, එම යෙදවුම් හා බැඳුණු නීති රාමු ආයතනික දත්තවල ආරක්ෂාව සහ අයිතිය තහවුරු කරන්නේද යන්න සැක හැර දැනගත යුතුම ය.

- **ශ්‍රම බලකායේ කුසලතා සංවර්ධනය**
  කාර්යාල කාර්ය ප්‍රවාහයන් සමග AI ඒකාබද්ධ වී ඇති බැවින් සේවකයින්ට නව භූමිකා වෙත සංක්‍රමණය වීමට උපකාර කිරීම සඳහා සංස්ථා විසින් ප්‍රමුඛත්වය දිය යුතු ය. කෘත්‍රිම බුද්ධි කළමනාකරණය, දත්ත සාක්ෂරතාව සහ සංකීර්ණ ගැටලු විසඳීම කෙරෙහි අවධානය යොමු කරන පුහුණු වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම මගින් අනාගත වෙනස්කම් සඳහා ශ්‍රම බලකාය සූදානම් කළ යුතු ය.

## නිගමනය

ඵලදායිතාව ඉහළ නැංවීම, පුනරාවර්තන හෝ සාමාන්‍ය කාර්යයන් ස්වයංක්‍රීය කිරීම සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම සක්‍රීය කිරීම මගින් කාර්යාල කටයුතුවල විප්ලවීය වෙනසක් ඇති කිරීමට AI හට හැකියාව ඇත. කෙසේ වෙතත්, මෙම ප්‍රතිලාභ

සදාචාරාත්මක අභියෝග, දත්ත රහස්‍යතා අවදානම්, රැකියා විස්ථාපනය සහ සයිබර් ආරක්ෂණ දුර්වලතා ඇතුළු සැලකිය යුතු ගැටලුද සමග පැමිණේ. ආයතන විසින් මෙම ගැටලු විසඳීමට ක්‍රියාශීලී උපාය මාර්ග අනුගමනය කළ යුතු අතර එහි අවදානම් අවම කර ගනිමින් එහි ප්‍රතිලාභ උපරිම වන ආකාරයෙන් AI යෙදවුම් ක්‍රියාත්මක කළ යුතු ය.

මූලාශ්‍ර


- McAfee and E. Brynjolfsson, Machine, Platform, Crowd: Harnessing Our Digital Future, 1st ed., New York: W. W. Norton & Company, 2017.
- T. Dastin, "Amazon scraps secret AI recruiting tool that showed bias against women," Reuters, Oct. 10, 2018. [Online]. Available: https://www.reuters.com.
- M. Mitchell et al., "Algorithmic bias: from discrimination discovery to fairness-aware data mining," ACM SIGKDD Explorations, vol. 12, no. 1, pp. 39-49, 2020.
- J. Manyika et al., "What AI can and can't do (yet) for your business," McKinsey Global Institute, Dec. 6, 2017. [Online]. Available: https://www.mckinsey.com.
- R. Cummings, "The increasing threat of AI-enabled cyberattacks," Forbes, Jul. 20, 2021. [Online]. Available: https://www.forbes.com.
- N. Papernot et al., "The limitations of deep learning in adversarial settings," in Proceedings of the IEEE European Symposium on Security and Privacy, 2016, pp. 372-387.
- Cath et al., "Artificial intelligence and the 'good society': The US, EU, and UK approach," Science and Engineering Ethics, vol. 24, no. 2, pp. 505-528, 2018.
- E. Brynjolfsson and A. McAfee, "The business of artificial intelligence: What it can and cannot do for your organization," Harvard Business Review, Jul. 2017.



# ශ්‍රී ලංකාවේ හුවමාරු වූ අතීත වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ මූලික හැඳින්වීමක්

**අරුණ ශාන්ත**
කෞතුකාගාර පාලක, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

අතීත වෙළෙඳාම යනු හුදු ආර්ථික ක්‍රියාවක් ම පමණක් නොව එය මානව සමාජවල ගැඹුරු අන්තර් සමාජායතනික සබඳතා ගොඩනන්වන ලද සංකීර්ණ ක්‍රියා පද්ධතියක් වශයෙන් සැලකිය හැකි වේ. ඓතිහාසික වශයෙන් භාවිත වෙළෙඳ ද්‍රව්‍ය අධ්‍යයනය කිරීම එකී තත්ත්ව වඩාත් ගැඹුරින් විශ්ලේෂණය කිරීමෙහිලා නව මානයක් විවර කර දෙයි. ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාසයේ සුවිශේෂි මං සලකුණු මැයෙන් ඉදිරිපත් කෙරෙන ලිපි මාලාවේ සිව්වන ලිපිය වන මෙයින්, ඓතිහාසික වශයෙන් මෙරට හුවමාරු වූ වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ මූලික හැඳින්වීමක් සිදු කිරීම අරමුණු කෙරේ. එහි දී විශේෂ අවධානය යොමුව ඇත්තේ මෙරටින් අපනයනය හෝ ප්‍රතිඅපනයනය කරන ලද වෙළෙඳ ද්‍රව්‍ය සම්බන්ධයෙනි. මන්දයත් එමගින් මෙරට අර්ථික දියුණුව හා සංවර්ධනය, ධන උත්පාදන මාර්ග, කර්මාන්ත හා නිෂ්පාදන ක්‍රියාවලිය, පරිභෝජන රටාව හා එහි වෙනස්වීම්, දේශිය මෙන් ම ජාත්‍යන්තර වෙළෙඳ ජාලයට සම්බන්ධ වීම හා එහි හෙබවූ භූමිකාව, සමාජායතනික සැකැස්ම කෙරෙහි ඇති කළ බලපෑම හා විලාසිතාව වැනි අතීත තත්ත්ව රැසක් අවබෝධ කර ගැනීමේ හැකියාව පවතින බැවිනි. එහෙත් මෙම අධ්‍යයනයේ දී පැනනගින ගැටලුව නම්, ප්‍රස්තුතය පිළිබඳ විස්තරාත්මක ඓතිහාසික තොරතුරුවල පවතින හිඟතාවයි. සෙසු සාමාජායතනික දත්ත හා සාපේක්ෂ ව ඓතිහාසික මූලාශ්‍රයවල වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ විස්තර අන්තර්ගත ව ඇත්තේ ඉතා අල්ප වශයෙනි. එහෙයින් සාහිත්‍ය මූලාශ්‍රයවල අන්තර්ගත ව පවතින තොරතුරු, පුරාවිද්‍යාත්මක දත්ත මෙන් ම ජනශ්‍රැතිගත කරුණු ආදිය තුළනාත්මක ව විශ්ලේෂණය කිරීමේ ප්‍රවේශය වඩාත් ප්‍රතිඵල සහගත වෙයි. විශේෂයෙන් ම මෙරටින් අපනයනය කරන ලද වෙළෙඳ ද්‍රව්‍ය රැසක් පිළිබඳ තොරතුරු දේශාටන වාර්තා ඇතුළු විදේශීය සාහිත්‍ය මූලාශ්‍රයවලින් සපයාගත හැකිව තිබේ.

## වෙළෙඳ ද්‍රව්‍ය

වංසකතා ප්‍රධාන සාහිත්‍ය මූලාශ්‍රය විශ්ලේෂණය කිරීමේ දී දේශීය වෙළෙඳ පොළෙහි අලෙවි වූ වෙළෙඳ භාණ්ඩ අතර විවිධ ධාන්‍ය වර්ග, සියඹලා, කුළුබඩු, වළං, මැටි බඳුන් ආදි මුළුතැන් ගේ උපකරණ, කපු ආදි රෙදිපිළි වර්ග ද බුලත්, පුවක් වැනි ද්‍රව්‍ය කෙරෙහි ද වැඩි වැදගත් කමක් හිමිව තිබූ බව පෙනේ. සාමාන්‍ය ජනයා අතර සංසරණය වූ මෙම භාණ්ඩ බොහෝ විට එදිනෙදා ජීවිතයේ ප්‍රයෝජනය සඳහා ගත් ඒවා ය. විදේශීය වෙළෙඳුන් විසින් මෙහි ගෙන ආ ද්‍රව්‍ය ලෙස සේද, මස්ලින්, ගෝස් ආදි රෙදිපිළි, රස ගැන් වූ මත් ද්‍රව්‍ය, ඔලිව් තෙල්, රට ඉඳි, පිඟන් භාණ්ඩ, වීදුරු, පබළු, ලැපිස් ලසුලී, කානේලියන් ආදි දුර්ලභ ඛනිජ ද්‍රව්‍ය, අශ්වයන් ප්‍රධාන වේ. ඒවා බොහෝ විට සුඛෝපභෝගී භාණ්ඩ වශයෙන් සැලකුණු බවට ලක්ෂණ පෙන්නුම්

කෙරන අතර, ඉහළ සමාජ ස්ථරය නියෝජනය කළ පිරිස්වල වැඩි පරිභෝජනට ලක් වූ ආකාරය හඳුනාගත හැකි වේ. සේද, කපු පිළි හා අනර්ඝ තත්ත්වයේ පිඟන් භාණ්ඩ චීනයෙන් ගෙන ආ වෙළෙඳ භාණ්ඩ අතර ප්‍රමුඛ වේ. කපු පිළි, දුර්ලභ ඛනිජ වර්ග, වර්ණකාරක හා ඇතැම් ඖෂධ වර්ග ඉන්දියාවේ සිට ද අලිඇතුන්, ගම්මිරිස් ආදි කුළුබඩු අග්නිදිග ආසියාතික ප්‍රදේශවල සිට ද මෙරටට ආනයනය කර තිබේ. මෙලෙස ගෙන් වූ ඇතැම් භාණ්ඩ පරිභෝජනයට පමණක් නොව ප්‍රතිඅපනයනය සඳහා ද වූ බවට පැහැදිලි තොරතුරු අනාවරණ වේ. එකී ද්‍රව්‍ය ද ඇතුළු ව මෙරටින් අපනයනය කරන ලද වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු පහත සවිස්තරාත්මක ව දක්වා තිබේ.

### මැණික්

මුල් ඓතිහාසික සමයේ සිට ම මෙරට, මැණික් හා අර්ධ මාණික්‍යමය පාෂාණ සම්බන්ධයෙන් ජනප්‍රියත්වයක් ප්‍රකට කළ බව මැණික්කරුවන් පිළිබඳ කියැවෙන පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් අනාවරණය වෙයි. සංස්කෘතික සබඳතා ගොඩනගා ගැනීමේ අරමුණින් දේවානම්පියතිස්ස රජු (ක්‍රි.පූ. 250-210) ඉන්දියාවට යවන ලද දූත ගමන්වල දී පඬුරු ලෙස මැණික්වලට ලැබුණු වැදගත්කම පිළිබඳ මහාවංසයේ එන විස්තරය, මේ සම්බන්ධයෙන් දේශීය සාහිත්‍ය මූලාශ්‍රයවල අන්තර්ගත විස්තරවලට නිදසුන් සපයයි. විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය සැලකීමේ දී, ක්‍රි.පූ. තුන්වන සියවසේ දී පමණ ඉන්දියාවේ ජීවත් වූ කෞටිල්‍ය නමැති බ්‍රාහ්මණයා විසින් රචිත 'අර්ථ ශාස්ත්‍රය' කෘතියේ මෙරට හඳුන්වා ඇත්තේ මැණික් උපදින භූමියක් ලෙසිනි. චීන දේශාටක භික්ෂුවක් වූ හියුංසැන් (ක්‍රි.ව. 602-664) හිමියන්ගේ 'භ්‍රමණ වෘත්තාන්ත' නම් කෘතියට අනුව මෙරට 'රත්නද්වීප' ලෙස නම් වීම කෙරෙහි, මැණික් සම්බන්ධයෙන් මෙරටට හිමිවූ ජනප්‍රියත්වය ඉවහල් වූ බව කියැ වේ. තව ද, භට්ටස්වාමිගේ අර්ථශාස්ත්‍ර ටීකාව, ටොලමිගේ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය, පෙරිප්ලස් ඔෆ් එරිත්‍රියන් සී, වරාහමිහිරගේ බෘහත්සංහිතාව, ෆාහියන් වාර්තාව, කොස්මස්ගේ පර්සියානු යුද්ධ, ප්‍රකෝපියස්ගේ ටොපොෆ්‍රැෆියා ක්‍රිස්තියානියා වැනි කෘතිවලින් ද එකී කරුණු සනාථ කෙරේ. ඒ හැරුණු විට වැනිස් ජාතික මාර්කෝ පෝලෝ (ක්‍රි.ව.1254-1324) ද මෙරට මැණික් පිළිබඳ සඳහන් කර තිබේ. චීනයේ කුබ්ලායි ඛාන් අධිරජු (ක්‍රි.ව.1215-1294)විසින් මෙරටට එවනු ලැබූ දූත ගමන් දෙකක් පිළිබඳ ව සඳහන් කරන හෙතෙම, ඉන් එක් දූත ගමනක් මෙරට පැවති විශාල මැණිකක් ලබා ගැනීමේ අරමුණින් දියත් කළ එකක් බව වැඩි දුරටත් විස්තර කර තිබේ. තව ද, ඉබන් බතූතා (ක්‍රි.ව. 1304 - 1368) අබූ අබ්දුල්ලාහ් ඉබ්න් අල් කාෆි නමැත්තෙකු විසින් සිය රජුට ලබාදීම සඳහා මෙරටින් විශාල පරිමාණයේ මැණික් ගල් දෙකක් සපයා ගැනීම පිළිබඳ සඳහනක් සිය අතුරු වාර්තාවකට එක් කර තිබේ.

චීන දකුණු සුං රාජ වංශ සමය නියෝජනය කරන චව්-ජූ-ක්වාන් (1127-1279) නම් ලේඛකයාගේ වාර්තා මේ සම්බන්ධයෙන් වඩාත් කැපී පෙනෙනුයේ එහි මෙරටින් හමුවන සුවිශේෂී මැණික් වර්ගයක් නම් කර තිබීම හේතුවෙනි. ඒවා නම්, වෛරෝඩි මාණික්‍ය වර්ගයයි. ඒ හැරුණු විට නිල් ගල් හා රතු ගල් වශයෙන් තවත් මාණික්‍ය හෝ අර්ධ මාණික්‍ය පාෂාණ වර්ග දෙකක් හඳුන්වා තිබේ. මෙරටින් ඉතා අනර්ඝ වෛරෝඩි අපනයනය කළ බවත් ඒවා චීනයේ ආභරණ සෑදීම සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගැනුණු බවත් හෙතෙම වැඩිදුරටත් විස්තර කර තිබේ. ඉෂාටාකි මෙරටින් ගෙනගිය පද්මරාග පිළිබඳ විස්තර සපයා තිබේ. ලක්දිව සඳහා ග්‍රීක ජාතිකයින් භාවිත කළ 'තප්‍රබේන්' යන නාමය ද 'පුෂ්පරාගය' යන අරුත් දෙන්නක් බව කියැවේ.

සමකාලීන වාණිජ ලෝකය තුළ මැණික්වලට හිමිව පැවති වැදගත්කම හා මෙරට මැණික් සඳහා හිමිව තිබූ ඉල්ලුම අභ්‍යන්තරික වශයෙන් මැණික් කර්මාන්තය ද කැපී පෙනෙන දියුණුවක් ඇති කළ බව මහාවංසයේ එන විස්තරවලින් හඳුනාගත හැකි වේ. එනම්, පළමුවැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව.1153-1186) සිය ඇමතිවරයෙකු භාරයේ 'අන්තංග ධුර' වශයෙන් මැණික් කර්මාන්තය පවත්වාගෙන යාම සඳහා වෙන ම කාර්යාංශයක් පත් කිරීම පිළිබඳ වන සඳහනයි. එයට අනුව මැණික් රැස් කොට නැව් ගණනින් විදේශගත කිරීමෙන් අදාළ කාර්යාංශය මහත් ධනය ගෙනදුන් බව කියැ වේ. තව ද, දාහතරවන සියවසට අයත් ගඩලාදෙණි ගිරි ලිපියේ මැණික් ගැරීම රජයේ අවසරයෙන් තොර ව සිදු කළ නොහැකි ක්‍රියාවක් වශයෙන් නම් කර තිබීමෙන්, මැණික් ඇතුළු ඛණිජ සම්පත් වෙළෙඳාම දිගින් දිගට ම මෙරට රාජ්‍ය ආදායම සැපයූ මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියාත්මක වූ බව පෙනේ. එහෙත් මැණික් කැණීම වසර පුරා සිදු කෙරුණු කාර්යයක් වශයෙන් හඳුනා ගත නොහැකි වේ.

### මුතු

ග්‍රීක ජාතික ප්ලිනීගේ වාර්තා අනුව රෝම අධිරාජ්‍යයාගේ බඳු නිලධාරීන් කුදිරමලේ තොටින් මෙරටට පැමිණි

බවත් (ක්‍රි.ව.41-54) රජු (චන්ද්‍ර මුඛසිව ක්‍රි.ව. 44 - 52 රජු සමය) සමග මුතු ලබා ගැනීම සඳහා ගිවිසුමකට එළඹි බවත් විස්තර වීමෙන් යටත් පිරිසෙයින් මුල් ඓතිහාසික සමයේ සිට ම මෙරට මුතු සඳහා ජනප්‍රියත්වයක් දැක්වූ බව තහවුරු වේ. මහාවංසයේ එන 'අන්තංග ධුර' නම් කාර්යාංශය මැණික් පමණක් නොව මුතු කර්මාන්තය සම්බන්ධයෙන් ද ක්‍රියා කර තිබේ. මුතු හමුවන ප්‍රදේශවල පාලනය රජු යටතේ පවත්වාගෙන ගොස් ඇති අතර ඒවා වෙළෙඳාමෙන් ලැබෙන ආදායමෙන් අඩක් රජුට හිමි වූ බව කියැ වේ. විශේෂයෙන් ම මාන්තෙයි නොහොත් මන්නාරම සැලකෙනුයේ මුතු කිමිදීමෙන් විශාල ලාභ ගෙනදුන් වෙරළ තීරයක් වශයෙනි. මාර්කෝ පෝලෝගේ වාර්තාවල මන්නාරමින් හමුවූ කාන්තිමත් මුතු පිළිබඳ විස්තර කොට තිබේ. මන්නාරම හැරුණුවිට කුදිරමලය ද ජනප්‍රිය මුතු නිධියක් පැවතුණු තැනක් බව කියැවේ. ඉබන් බතුතාට අනුව එවක මෙරට වයඹදිග වෙරළ තීරයේ මුතු කිමිදීමේ අයිතිය යාපන රාජ්‍යය සතුවුණු අතර, හෙතෙම ලංකාවට පැමිණෙන විට යාපනයේ ආර්ය චක්‍රවර්තී නම් දැරූ පාලකයා සිට ඇත්තේ මුතු කිමිදීමෙන් ලද වස්තු නිරීක්ෂණය කරමිණි. තව ද, එහි මුතු කිමිදීමේ නියැළුණු පිරිස් ඉතා කාර්යබහුල වූ බවත් තවත් පිරිසක් මුතු වර්ග කිරීමේ කාර්යයේ යුහුසුළුවූ බවත් වැඩි දුරටත් විස්තර කර තිබේ. වැන්ග් ද යුවාන් (ක්‍රි.ව.1311-1350) නම් චීන වාර්තාකරුවා ද ඉහත තොරතුරු සනාථ කර සිටියි. දහසයවන සියවස නියෝජනය කරන බාබොසාගේ වාර්තාව ද මෙරට මුතු කිමිදීම විස්තර වන අතර, එහි දී අදාළ කාර්යයෙන් ලැබෙන කුඩා මුතුකැටවල අයිතිය මුතු කිමිදෙන්නන්ට ද විශාල මුතු ඇටවල අයිතිය රජුට ද හිමිවූ බව විස්තර වේ. පෘතුගාලයේ දොන් මැනුවල් රජු (ක්‍රි.ව. 1469 - 1521) විසින් එවන ලද ලිපියකට ප්‍රතිචාර දක්වමින් ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා (ක්‍රි.ව.1450-1510) සඳහන් කරනුයේ ලෝකයේ ඉස්තරම් ම වර්ගයේ සිඟිති මුතු හා විශාල මුතු නිපදවන්නේ ලක්දිව බවත් ඒවා ලබා ගත හැක්කේ මෙරටින් ම පමණක් බවයි. පේදුරු තිසේරා විසින් අප්‍රේල් හා මැයි මාස දෙක මෙරට මුතු කිමිදීම සිදු කරන කාල පරිච්ඡේදය වශයෙන් හඳුන්වා තිබේ.

එමර්සන් ටෙන්ට් (1797) රොබට් පර්සිවේල් (1848) බඳු බ්‍රිතාන්‍ය ජාතිකයන් ලංකාවේ මුතු කිමිදීම් විස්තර කර තිබේ. බ්‍රිතාන්‍ය පාලනය යටතේ හලාවත, පුත්තලම, සිලාවතුර, මරිච්චකට්ටි, අරිප්පුව හා මන්නාරම වැනි ප්‍රදේශවල මහා පරිමාණයෙන් මුතු කිමිදීමේ කටයුතු සිදුව ඇති අතර, මන්නාරම, අරිප්පුව හඳුන්වා ඇත්තේ 'මුතු අගනුවර'වශයෙනි. අරිප්පුවේ මුතු කඩන කාලයට තිස්දහසක් පමණ ජනතාවක් අරිප්පුව ප්‍රධාන වයඹදිග වෙරළට රැස්වූ බවත් දින සීයයකට ආසන්න කාලයක් මෙම වෙරළේ තවකාලික නගරයක් ඉදි ව පැවති බවත් මුතු මිළදී ගැනීමට විශාල විදේශීය වෙළෙඳුන් ප්‍රමාණයක් මෙහි ඇදී ආ බවත් ජේම්ස් ස්ටුවට් (1848) විසින් රචිත 'ඇන් එකවුන්ට් ඔෆ් ද පර්ල් ෆිෂරි' කෘතියේ විස්තර කර තිබේ. යටත් පිරිසෙයින් ඉකුත් සියවස ආරම්භය දක්වා ම වසරේ තෝරාගන්නා ලද කාල පරිච්ඡේදවල දී අපනයනය සඳහා මුතු කිමිදීම් කටයුතු මෙරට තුළ සිදු වූ බව ට වාර්තා වේ.

### අලි - ඇතුන්

මහා පරිමාණයෙන් අලි ඇතුන් වෙළෙඳාම හා ප්‍රතිඅපනයනය පිළිබඳ මූලාශ්‍රය සාධක මධ්‍යතන යුගයට අදාළ ව පෙන්නුම් කෙරෙන නමුදු, මුල්




මන්නාරම, අරිප්පුව වෙරළේ මුතු කිමිදීම හා මුතු මිලදී ගැනීමට අපේක්ෂාවෙන් සිටින විදේශීය වෙළෙඳුන් - 19වන සියවසේ අග භාගය (උපුටා ගැනීම - https://www.lankadeepa.lk/rasawitha - 2017/9/4)

ඓතිහාසික යුගයේ සිට ම මෙරට ඇත්දත් ශිල්පීන් පිළිබඳ අභිලේඛන හමුවීම මෙන් ම මහාවංසය ආදී සාහිත්‍ය මූලාශ්‍රයවල ඇත්දත් කැටයම්කරණය සඳහා ඍජු රාජ්‍ය අනුග්‍රහ හිමිවූ බවට වන විස්තරවලින්, මෙම කර්මාන්තයේ ඉතිහාසය ඉන් බොහෝ ඈතට විහිද යන බව පැහැදිලි වේ. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ දී පමණ ඉන්දියාවේ ග්‍රීක තානාපතිවරයෙකු ලෙස සේවය කළ මෙගස්තිනිස් (දළ වශයෙන් ක්‍රි.පූ. 305 - 281) සඳහන් කරනුයේ ලංකාවෙන් ඉන්දියාවේ කාලිංග යට ඇතුන් අපනයනය කළ බවයි. මෙකී කරුණ ඉන් සියවස් පහකට පමණ පසුව ජීවත් වූ ඊලියන් (ක්‍රි. ව. 170-235) නමැති වාර්තාකරුවා ද තහවුරු කර තිබේ. එනම්, ක්‍රි.ව. තුන්වන සියවසේ දී ද මෙරට පාලකයන් විසින් ඉන්දියාවේ කාලිංග දේශය ට ඇතුන් අපනයනය සිදු කළ බවයි. තව ද, ක්‍රි.ව. 1001 දී ඉන්දියාවේ ථානේෂ්වර් රාජ්‍යයට පහර දුන් සෂ්නිහි මොහොමඩ් (ක්‍රි.ව.998-1041) හට ලංකාවේ උපන් ඇත් හමුදාවකට ද මුහුණ දීමට සිදු වූ බවට වන සඳහනින් පෙනී යන්නේ, ඉන්දියානු වෙළෙඳපොළ තුළ මෙරට හීලෑ අලි ඇතුන් සඳහා ඉහළ ඉල්ලුමක් පැවති බවයි. මෙම තත්ත්වය දිල්ලි සුල්තාන් අධිරාජ්‍යය බිහිවීමත් සමඟ වර්ධනය වූ බව පෙනෙයි. ඒ හැරුණුවිට කොස්මස්, අබ්දුර් රසාක්, බර්බරෝසා ආදි වාර්තාකරුවන් ද අලි ඇතුන් ඉන්දියාවට අපනයනය කිරීම සම්බන්ධයෙන් විස්තර කර තිබේ.

ඒ අනුව ඇතුන් වෙළෙඳාම සම්බන්ධයෙන් වන ඉහත තොරතුරු විශ්ලේෂණයේ දී මහනුවර රාජධානි සමය වන විට සක්‍රීය ව පැවති කුරුවේ කාර්යාංශය නොහොත් මේ සම්බන්ධයෙන් වූ රාජ්‍ය දෙපාර්තමේන්තුව, පෙර අවධියේ සිටම පැවත ආ ආයතනයක් වීමේ වැඩි සම්භාවිතාවක් පවතින බව පෙනේ. මහාවංසයේ සඳහන් මහා පරාක්‍රමබාහු රජුගේ බුරුම දේශ ආක්‍රමණය අලි ඇතුන් අපනයනය ඇතුළු වෙළෙඳ කටයුතු කිහිපයක් කෙරෙහි බුරුම පාලකයින් ගෙන ගිය අත්තනෝමතික ප්‍රතිපත්ති මැඬලීම සඳහා මෙහෙයවනු ලැබූවක් බව කියැවේ. ලංකාවේ සිට බුරුමයට ලඟා වෙන නැවක් සඳහා කප්පම් ලෙස ඇතෙකු බැගින් ලබාදීමේ සිරිතක් එහි විස්තර වෙයි. එහෙයින් මෙරට අලි-ඇතුන් පමණක් නොව විදේශීය අලි-ඇතුන් විකිණීම හෝ ප්‍රතිඅපනයනය ද සිදුවූ බව පැහැදිලි වේ. එමෙන් ම, පරාක්‍රමබාහු රජුගේ



අලි - ඇතුන් ඇල්ලීම සඳහා ඇත් ගාල් බැඳීම- කුරුණෑගල - 1825
(උපුටා ගැනීම - https://lankapura.com/elephant-hunt-kurunegal)

නයිනතිවු ලිපියෙහි ද අලි ඇතුන් හා අශ්වයින් පටවා ගත් නෞකා ඌරාතොට වරායේ දී අනතුරට ලක් වූ විට රැගෙන යන සතුන්ගේ වටිනාකමෙන් හතරෙන් එකක් භාණ්ඩාගාරයට ගෙවිය යුතු බව කියැවේ. පසු කාලීන ව ජුවාම් ඩි බරෝස් (ක්‍රි.ව. 1496 -1570) නම් වූ පෘතුගීසි ලේඛකයා ද ඇතුන් හත් දෙනෙකු පටවා ගත් නැවක් ලක්දිව සිට කැලිකට් වෙත ළඟා වූ බවත් එහි සිට කම්බාය හෙවත් කැම්බ්‍රෙයි දක්වා යාත්‍රා කළ ආකාරයත් සිය වාර්තාවෙහි සටහන් කර තිබෙයි. එමෙන් ම බ්‍රිතාන්‍ය ජාතික ඇලෙක්සෙන්ඩර් ජෝන්ස්ටන් (ක්‍රි.ව. 1775 -1849) මෙරට අලි-ඇතුන් හා ඇත් දත් වෙළෙඳාම පිළිබඳ වාර්තා කර ඇති අතර, මුස්ලිම් වෙළෙඳුන් ගාල්ල ප්‍රදේශයේ දී ඇතුන් හා ඇත්දත් එකතු කිරීමේ නිරත වූ බවත් ඔවුන් විසින් මන්නාරම ප්‍රදේශවල අලි ඇතුන් ප්‍රති අපනයනය සඳහා ගාල් කර තිබෙනු නිරීක්ෂණය කළ හැකි වූ බවත් වැඩි දුරටත් විස්තර කර තිබේ. බ්‍රිතාන්‍ය රජය යටතේ තවදුරටත් ඇතුන් අපනයනය සක්‍රීය ලෙස පවත්වාගෙන ගොස් ඇති අතර, ඉකුත් සියවසේ මැදභාගය දක්වා ම ඇත් ගාල් බැඳීම හා අලි-ඇතුන් වෙන්දේසිය වැනි කටයුතු පවත්වාගෙන යෑම සිදු කළ බව පෙනේ.

## අශ්වයන්

ප්‍රවාහනය සම්බන්ධයෙන් දක්වන ඉහළ උපයෝගීතාව හේතුවෙන් අතීත ලෝකය තුළ අශ්වයා සැලකෙනුයේ අතිශයෙන් සුඛෝපභෝගී වෙළෙඳ අයිතමයක් වශයෙනි. දේශීය මූලාශ්‍රයවල අශ්ව වෙළෙඳාම පිළිබඳ විස්තර ඇතත් මෙරට අශ්වයන් සඳහා ජාත භූමියක් නොවන හෙයින් ඒවා, අශ්වයන් ප්‍රතිඅපනයනය හා බැඳි විස්තර වශයෙන් සැලකිය හැකි වේ. ඈත අතීතයේ සිට අශ්වයන් මෙරටට ආනයනය කළ බව අනුරාධපුර ඇතුල් පුරයේ සිදු කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම් වල දීමුල් ඓතිහාසික යුගය නියෝජනය කරන අශ්ව දත් හා අස්ථි කොටස් හමුව තිබීමෙන් තහවුරු වේ. තව ද, ක්‍රි. පූ. දෙවන සියවසේ දී පමණ මෙරටට ආක්‍රමණයක් එල්ල කළ සේන හා ගුත්තික (ක්‍රි.පූ.337-215) යන දෙදෙනා මහාවංසය ඇතුළු සාහිත්‍ය මූලාශ්‍රයවල හඳුන්වනු ලබන්නේ අශ්ව වෙළෙඳුන් දෙදෙනෙක් වශයෙනි. පර්සියානු හා ඉතියෝපියානු වෙළෙන්දන් තරගකාරි ලෙස මෙරටට අශ්වයින් රැගෙන ආ බව "පෙරිප්ලස් ඔෆ් ද එරිත්‍රියන් සී" කෘතියෙහි හා ප්‍රකෝපියස් මෙන් ම කොස්මස්ගේ සටහන්වලින් ද පැහැදිලි වේ. මාර්කෝ පොලෝ ද මෙරට අසුන් ප්‍රතිඅපනයනය සම්බන්ධයෙන් විස්තර කරන අතර ඔහුට අනුව එකී වෙළෙඳ කටයුතු මෙහෙයවා ඇත්තේ මුස්ලිම් වෙළෙඳුන් විසිනි. එමෙන් ම, ඉහත සඳහන් කළ පරිදි පරාක්‍රමබාහු රජුගේ නයිනතිවු ලිපියෙහි අලි ඇතුන් සේ ම අශ්වයින් පටවා ගත් නෞකා ඌරාතොට වරායේ දී අනතුරට ලක් වූ විට රැගෙන යන සතුන්ගේ වටිනාකමෙන් හතරෙන් එකක් භාණ්ඩාගාරයට ගෙවිය යුතු වූ බව කියැ වේ. පෘතුගීසි හා ලන්දේසීන් පහත රට ප්‍රදේශවල බලය තහවුරු කර ගැනීමත්, පසුව ව බ්‍රිතාන්‍යන් සිය යටත් විජිතයක් බවට පත් කර ගැනීමත් සමග මෙරටට අවශ්‍ය අසුන් සැපයීම සිදුව ඇත්තේ යුරෝපයෙනි.

## ගවයන්

මෙරට ගව විශේෂ විදේශීය රාජ්‍ය සඳහා හඳුන්වා දීමට ගත් උත්සාහයක් පිළිබඳ ඉතා දුර්ලභ සටහනක් චීනයේ හං රාජවංස වාර්තාවලට අන්තර්ගත ව තිබේ. එනම්, කි.ව. 97 දී චීනය බලා ගිය ලාංකේය දූත පිරිසක් විසින් මී ගවයන් හා මොල්ලිය සහිත ගවයන් එරටට ගෙන ආ බවයි. තව ද, මේ අතර සිටි මී ගවයන් මඩ ගොවිතැන සඳහා ඉතා යෝග්‍ය වූ බව එහි විස්තර කර තිබේ. එහෙයින් එක් එක් කාල පරිච්ඡේදවල දී පවතින වෙළෙඳ ප්‍රවණතාවන්ට අනුරූප ව මෙරට සුලභ සම්පත් වෙළෙඳ ද්‍රව්‍ය ලෙස විදේශ රාජ්‍යයන් වෙත හඳුන්වා දීමේ සම්ප්‍රදාය පවතින්නට ඇති බව මෙමගින් උපකල්පනය කළ හැකි වේ.

## රෙදි - පිළි

චීන සේද රෙදිවල ජනප්‍රියත්වය පසුබිම් කොට ගෙන රෙදි-පිළි ප්‍රමුඛ ආනයන භාණ්ඩයක් ලෙස හඳුන්වනු ලැබෙන නමුදු, මුල් ඓතිහාසික සමයේ සිට ම මෙරටින් රෙදි-පිළි අපනයනය සිදුවූ බවට මූලාශ්‍රයගත තොරතුරු හමුවීම විශේෂත්වයකි. රෙදි පිළි තොගයක් රැගෙන ඉන්දියාවේ භාරුකච්ඡ වරායට වෙළෙඳාම පිණිස ගිය වෙළෙන්දෙකු පිළිබඳ ව තීර්ථකල්ප නම් කෘතියේ එන සඳහන මෙයට නිදසුන් සපයයි. රාජතරංගනිය නමැති කාශ්මීර වංසකථාවෙහි මෙරට කපු පිළි සඳහා ඉන්දියානු වෙළෙඳපොළෙහි පැවති ඉල්ලුම පිළිබඳ අනාවරණය වන කථා පුවතක් හඳුනාගත හැකි වෙයි. 'මිහරකුල' නමැති ඉන්දියානු රජුගේ බිසව ලක්දිවින් ගෙන යන ලද කපු පිළි ඇඟ ලා ගත් බව ද ඉන් එක් රෙද්දක ලක් රජුගේ පා සටහනක් දැක කෝප වූ රජු මෙරට ආක්‍රමණය කළ බව ද එහි සඳහන්.ව තිබේ. තව ද, මානසොල්ලාසය නමැති කෘතියේ රාජකීයයන්ගේ ඇඳුම් සැකසීම සඳහා රෙදි රැගෙන ගිය රටක් ලෙස ලංකාව ද නම් කර තිබේ. "පෙරිප්ලස් ඔෆ් ද

එරිත්‍රියන් සී" නමැති කෘතියෙහි ද මෙරට නිපදවන ලද 'මස්ලින්' නැමති රෙදි වර්ග යක් පිළිබඳ සඳහන් වෙන අතර, ඒවා ඇගයෙන්නේ අපනයන වෙළෙඳ ද්‍රව්‍යයක් වශයෙනි. එමෙන් ම, යාපහුවේ පළමුවන බුවනෙකබාහු රජු (ක්‍රි.ව.1271-12851) විසින් වෙළෙඳ සබඳතා තර කර ගැනීමේ අරමුණින් ඊජිප්තුවේ සුල්තාන්වරයා වෙත යවන ලද සන්නසෙහි මෙරටින් අපනයනය කරන වෙළෙඳ ද්‍රව්‍යයක් ලෙස මස්ලින් රෙදි නම් කර තිබීමෙන්, යටත් පිරිසෙයින් "පෙරිප්ලස් ඔෆ් ද එරිත්‍රියන් සී" කෘතිය රචනා වූ ක්‍රි.ව. උදාව අවට යුගයේ සිට සියවස් දොළහකට ආසන්න දීර්ඝ කාල පරිච්ඡේදයක් පුරා මෙකී අපනයන ද්‍රව්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් මෙරට තුළ අවිච්ඡින්න ව පැවති බව උපකල්පනය කළ හැකි වේ.

ඉහළ නම්‍යතාවයෙන් හෙබි අවිආයුධ තැනීමට දක්වූ සහජ උපයෝගීතාවයි. යටත් පිරිසෙයින් වසර දහසකට ආසන්න කාල පරිච්ඡේදයක් පුරා මැදපෙරදිග මෙන් ම යුරෝපයේ අවිආයුධ තැනීම සම්බන්ධයෙන් භාවිත අධිතාක්ෂණික අමුද්‍රව්‍ය වශයෙන් ද ඩැමැස්කස් වානේ හඳුනාගෙන තිබේ. ඓතිහාසික වශයෙන් ඉන්දියාව ඇතුළු ආසියානු කලාපයේ රටවල මේවා නිෂ්පාදනය වූ බවට පැහැදිලි සාධක හමුවන අතර, ඒවා මෙරටට සම්බන්ධ වෙළෙඳ භාණ්ඩයක් වශයෙන් ඇගයෙන්නේ මධ්‍යකාලීන යුරෝපීය ජන සාහිත්‍යයේ, එහි ආනයනය කළ වෙළෙඳ ද්‍රව්‍යය අතර සෙරෙන්ඩිබ් දේශයෙන් ගෙන ආ මෙම වානේ විශේෂය පිළිබඳව ද සඳහන්ව තිබීම හේතුවෙනි. එහෙයින් සමකාලීන ලංකාව ද



අත් යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය - 19වන සියවස මුල් භාගය
(උපුටා ගැනීම - https://www.alamy.com/stock-photo/ceylon-traditional-clothing.htm)

## වානේ

කෲසිබල් වානේ (Crucible Steel) යනුවෙන් හැඳින්වෙන මේවා යකඩ හා කාබන් මිශ්‍රිත ලෝහ විශේෂයකි. අතීත සිරියාවේ ඩැමැස්කස් නුවර හරහා යුරෝපයට හුවමාරුවූ බැවින් මේවා 'ඩැමස්කස් වානේ' වශයෙන් හැඳින්වුණු ලැබූ බව කියැ වේ. මෙම ලෝහයේ පැවති විශේෂත්වය නම්, යුධ උපකරණ ප්‍රධාන ව තියුණු හා

වානේ අපනයනය ඔස්සේ එකී ඓතිහාසික වෙළෙඳ ජාලයට සම්බන්ධ ව සිටි බව උපකල්පනය කළ හැකි වේ. තව ද, මෙහි විශේෂයෙන් අවධානය යොමු විය යුතු කරුණක් නම්, සුප්‍රකට බලංගොඩ, සමනලවැව ඓතිහාසික යකඩ උඳුන්වල නිෂ්පාදනය කර ඇති ලෝහ ද මෙම ඩැමස්කස් වානේ ගණයට අයත්වන බව හඳුනා ගෙන තිබීමයි.

## තඹ

ගොඩවාය පැරණි වරාය හා දකුණු මුහුදු තීරයේ මුහුදුබත් ව පවතින ක්‍රිස්තු වර්ෂ උදාව අවට කාල පරිච්ඡේදයට අයත් පැරණි නැව් ආශ්‍රයෙන් තඹ ලෝහයෙන් කළ මෙවලම් හමුවීමත් ඒවායේ ලෝහ සංයුතිය මෙරට ත්‍රිකුණාමලය, සේරුවිල ස්වභාවික තඹ නිධියෙන් හඳුනා ගැනෙන තඹ සංයුතිය හා සැලකිය යුතු සමානකම් දැක්වීමත් හේතුවෙන් ඓතිහාසික වශයෙන් මෙරට තඹ නිෂ්පාදන හෝ අමුද්‍රව්‍ය වශයෙන් නිර්යාත කිරීම කෙරෙහි අවධානය යොමුව පැවතියේ ද යන සැකය මතු වේ. තව ද, ඒ කෙරෙහි පසුබිම් වෙන විශේෂිත කරුණ ලෙස යටත් පිරිසෙයින් ක්‍රි.ව. උදාව අවට කාල පරිච්ඡේදයේ සිට හෝ සේරුවිල පිහිටි තඹ නිධිය පරිභෝජනය කළ බවට වන පැහැදිලි සාධක හමුව තිබීමයි. සේරුවිල ආශ්‍රිත ව තඹ කර්මාන්ත ශිල්පීන්, කර්මාන්ත ශාලා හා වෙළෙඳුන් ස්ථානගත වූ බවට අභිලේඛන මූලාශ්‍රයවලින් ද නගර බිහිවීම ඇතුළු සමාජායතනික ක්‍රියාවලිය නිර්මාණය වූ බවට ථූපවංසය ඇතුළු සාහිත්‍ය මූලාශ්‍රයවලින් ද පැහැදිලි තොරතුරු ප්‍රකට කෙරේ. එහෙයින් මේ ආශ්‍රිත නිෂ්පාදන හුදු පරිභෝජනයට පමණක් නොව අපනයනය සඳහා ද යොදා ගැනෙන්නට ඇති බව සහේතුක ව උපකල්පනය කළ හැකි වේ.

## පොල්

වර්තමානයේ මෙන් ම ඓතිහාසික වශයෙන් ද පොල්වල ඵල නැතහොත් පොල් ගෙඩි පමණක් නොව පොල් ගස ඇතුළු එහි සෙසු කොටස් ද විවිධ කාර්යයන් සඳහා ඉහළ උපයෝගීතාවක් ප්‍රකට කළ බවට පැහැදිලි සාධක හමුව තිබේ. හතරවන මිහිඳු රජු විසින් කුරුන්දි විහාරයට පොල් අරඹක් පූජා කළ බව, රජුට අයත් පුවරු ලිපියේ සඳහන් වේ. යටත් පිරිසෙයින් මධ්‍යකාලීන අවධිය වනවිට පොල් මෙරට ප්‍රධාන වැවිලි භෝගයක් වශයෙන් සැලකුණු අතර, දකුණු හා බටහිර වෙරළ තීරයේ විශේෂ ව්‍යාප්තියක් පෙන්නුම් කළ බව සාහිත්‍ය මූලාශ්‍ර සනාථ කරයි. ඒ අතර දඹදෙණියේ රජ පැමිණි දෙවන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1236 - 1270) විසින් දේවපතිරාජ නම් අමාත්‍යවරයා ලවා බෙන්තොට සිය නාමයෙන් පොල් උයනක් රෝපණය කරවීම සම්බන්ධ විස්තරය වඩාත් කැපී පෙනේ. මහාවංසයට අනුව එම උයන බෙන්තොට වෙහෙරේ සිට කළුගංතොට දක්වාම ව්‍යාප්ත ව පැවත තිබේ. එහෙත් පොල් ගෙඩි අපනයනය සම්බන්ධයෙන් ඍජු මූලාශ්‍රයගත තොරතුරු පෙන්නුම් නොකෙරේ. කෙසේ නමුදු අල්-ඉද්රිසි ගේ වාර්තා අනුව ඕමානය හා යේමනය ඇතුළු අරාබි රටවල නෞකා මෙරටට පැමිණීම කෙරෙහි කඹ සඳහා පොල් කෙඳි, නැව් තැනීම සඳහා පොල් පරාල, කුඹ ගස් තැනීම සඳහා පොල් කඳන් ලබා ගැනීම වැනි කරුණු ඉවහල් වූ බව කියැ වේ. එහෙයින් සමකාලීන වශයෙන් පොල් ගසට හිමිව තිබූ වැදගත්කම මොනවට පැහැදිලි වේ. තව ද පොල් තෙල් ලිහිසි ද්‍රව්‍යක් ලෙස නැව්වල කඹ හා කරදියට නිරාවරණයවන ස්ථානවල අලේප කිරීම සඳහා යොදා ගැනෙන්නට ඇති බවට උපකල්පනය කෙරේ. යුරෝපා ජාතීන්ගේ අගමනයත් සමග පොල් ගසට විශේෂ වාණිජ වැදගත්කමක් හිමි වූ අතර, ලන්දේසීන් විසින් කොප්පරා ලාභ ඉපැයිය හැකි අපනයන ද්‍රව්‍යක් වශයෙන් ප්‍රචලිත කළ බවට වාර්තා හමුව තිබේ.

## පුවක්

පොල් මෙන් ම පුවක් ද සමකාලීන වශයෙන් වාණිජ භෝගයක් ලෙස විශේෂ වැදගත්කමක් ඉසිලූ බවට ඓතිහාසික මූලාශ්‍රයවල තොරතුරු අන්තර්ගත වෙයි. නිදසුනක් ලෙස නිශ්ශංකමල්ල රජු (ක්‍රි.ව.1187-1196) විසින් පිහිටුවා ඇති පොළොන්නරුව ගල්පොත ශිලා ලේඛනයේ රත්‍රන්වලින් ගෙවීම් සිදු කොට පුවක් වතු මිලදී ගැනීම් සම්බන්ධයෙන් වන විස්තරය දැක්විය හැකි වේ. පසු කාලීන ව පුවක් ගස් මෙරට සංස්කෘතික හු දර්ශනයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වූ ආකාරය හඳුනාගත හැකි අතර, ගම් හා නගරවල වූ පුවක් වැටි හා අරඹ පිළිබඳ විස්තර සන්දේශ කාව්‍යවල ද අන්තර්ගතව තිබේ. විශේෂයෙන් ම 'මඩපුවක් දැමීම' වැනි තත් කර්මාන්තය හා බැඳි ඇතැම් ක්‍රියාකාරකම් අතීත අපනයනය සැකසුම් ක්‍රියාවලිය පිළිබඳ ඉඟි සපයයි. යටත් පරිසෙයින් මහනුවර රාජධානි සමයේ ද පුවක් මෙරට ප්‍රධාන අපනයන වෙළෙඳ ද්‍රව්‍යයක් ලෙස සැලකුණු අතර විශේෂයෙන් ම ලන්දේසීන් මේ සම්බන්ධයෙන් යුහුසුළු වූ බව පෙනේ. ඒ බව සනාථ කෙරෙනුයේ ලන්දේසි ඉඩම් තෝම්බුවල එක් එක් ඉඩම්වලින් ලබාගත් පුවක් අස්වැන්න පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු අන්තර්ගත ව පවතින බැවිනි.

## කෝමාරිකා

මධ්‍යතන යුගයට අදාළ ව මැදපෙරදිග කලාපයේ ඉහළ ජනප්‍රියත්වයක් අත් කර ගත් වෙළෙඳ ද්‍රව්‍යයක් ලෙස කෝමාරිකා නම් කළ හැකි වේ. අල්-ඉද්රිසිට අනුව මෙය එළවළුවක් හා පලා වර්ගයක් වශයෙන්

භාවිත කර ඇති අතර වසරේ ජූලි මාසයේ පිති එකතු කර සාරු ඉවත් කිරීම හා අව්වේ වේලා ගැනීම සිදු කෙරුණු බව කියැවේ. ඉෂ්ටාකිට අනුව විදේශීය වෙළෙඳුන් ලංකාවට පැමිණ ඇත්තේ පද්මරාග, කුළු බඩු හා කෝමාරිකා එක් රැස් කිරීමේ අරමුණිනි. චව් - ජු - ක්වාන් ද මේ බව තහවුරු කර තිබේ. ඒ අනුව සමකාලීන වශයෙන් කොමාරිකාවලට පැවති ඉල්ලුම හේතු කොට ගෙන මෙරට තුළ ද ඒවා අපනයන වෙළෙඳ භාණ්ඩයක් වශයෙන් සැලකුණු බව, ඉහත වාර්තා ඇසුරේ සහේතුක ව නිගමනය කළ හැකි වේ.

## සුවඳ ද්‍රව්‍ය

අතීත වෙළෙඳ කටයුතුවල දී විශේෂ අවධානය යොමුවූ සුඛෝපභෝගී වෙළෙඳ අයිතමයක් ලෙස සුවඳ ද්‍රව්‍ය නම් කළ හැකි වේ. විශේෂයෙන් ම ලාටු වර්ග හා දුම්මලවලට මෙහි දී වැඩි වැදගත්කමක් හිමි කර ගෙන තිබේ. මාර්කෝපොලෝට අනුව ලංකාව කට්ටකුමංජල් අලෙවිය සම්බන්ධයෙන් අන්තර් හුවමාර මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කර තිබේ. හෙතෙම, කට්ටකුමංජල් හඳුන්වා ඇත්තේ සුදු සාම්බ්‍රානි වශයෙනි. දුම්මල නිෂ්පාදනයට අවශ්‍ය පාෂාණ ද්‍රව්‍ය මෙරටින් අපනයනය කළ බව කියැවේ. පෘතුගීසි ලේඛකයෙකු වූ ගිරොලාමො සෙර්නිගිගේ වාර්තා අනුව මෙරට සිට කැලිකට් වරාය වෙත ගෙනගිය වෙළෙඳ ද්‍රව්‍ය අතර කට්ටකුමන්ජල් ද වූ බව කියැවේ.

## නැව් හා යාත්‍රා

අප්‍රකට නමුදු, දිගු කලෙක සිට ලංකාව නැව් හා මුහුදු යාත්‍රා නිෂ්පාදනයේ හා අලුත්වැඩියාවේ නිරත වූ බව සාහිත්‍ය මූලාශ්‍රයගත තොරතුරුවලින් සනාථ කෙරේ. ටාං රාජ වංශ වාර්තාවලට අනුව ක්‍රි.ව. අටවන සියවසේ පමණ චින නැව් තොටුපළවලට පැමිණි විශාල ම යාත්‍රා අතර ලාංකේය නැව්වලට හිමි වූයේ වැදගත් ස්ථානයකි. එයින් සනාථ කෙරෙන තවත් කරුණක් නම්, ක්‍රි. ව. පස්වන සියවස පමණ වන විට පවා මෙරට නෞකාවලට දිගු දුරක් යාත්‍රා කිරීමේ හැකියාව පැවති බවයි. මේ අනුව පෙනෙනුයේ තාක්ෂණයෙන් ඉහළ මට්ටමේ යාත්‍රා නිපදවීමේ හැකියාව මෙරට සතු වූ බවයි. පළමු පරාක්‍රමබාහු රාජ්‍ය කාලය පිළිබඳ මහාවංස විස්තරයේ රජු විසින් බුරුම දේශ ආක්‍රමණය සඳහා මාතොට (මන්නාරම), මඩුවාපි තොට (ඉරුප්පකඩවේලි) හා පල්ලවංකය (යාන් ඔය මුවදොර කලාපය) යන ස්ථානවල නැව් ඉදි කිරීම් කටයුතු සිදු කළ බවට තොරතුරු අන්තර්ගත වේ. එයින් පෙන්නුම් කෙරෙනුයේ නැව් කර්මාන්තය මෙරට නැගෙනහිර මෙන් ම බටහිර වෙරළ තීරයේ ද ව්‍යාප්ත ව පැවති බවයි. ඉහත ද උපුටා දැක්වූ, පළමු වන බුවනෙකබාහු රජු විසින් ඊජිප්තුවේ සුල්තාන්වරයා වෙත යැවූ සන්නසේ තම නාවික ශක්තිය පිළිබඳව සඳහන් කරන රජු වසරකට නැව් විස්සක් සකස් කර දීමේ හැකියාව මෙරට සතු වන බව පවසා තිබේ. වෙළෙඳාමෙන් ලබා ගත් සුවිශාල ආදායමත් දිගු කලෙක සිට නිරත වූ මුහුදු තරණයත් හේතු කොට ගෙන මේ වන විට ලාංකිකයින් නාවික තාක්ෂණයේ ඉහළ තලයකට ළඟා වෙමින් සිටි බව පෙනෙයි.

## දැව වර්ග

අතීත ලෝකයේ දාරුමය ආකෘති සුලභ වූ බැවින් දැව ශාඛ සඳහා විශේෂ ඉල්ලුමක් පැවතීම බෙහෙවින් අපේක්ෂා කළ හැකි තත්ත්වයකි. විශේෂයෙන් ම ලොව ප්‍රධාන සාගර වෙළෙඳ මාර්ග නියෝජනය කළ දූපතක් වූ හෙයින් නැව් හා මුහුදු යාත්‍රා නිර්මාණයට මෙන් ම, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මෙහි දැවවලට ඉල්ලුමක් පැවති බව උපකල්පනය කළ හැකි වේ. ජනශ්‍රැතිගත කරුණු අනුව මෙරට කළුවර හෝ කළුමැදිරිය ශාක (*Ceylon Ebony or Diospyros ebenum*) දැවමය ශාක වශයෙන් විශේෂ ඇගයීමට ලක්ව තිබේ. ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් එකී කරුණු සනාථ කරන අතර කල්පැවැත්ම හා දැවවල වර්ණය ඒ කෙරෙහි ඉවහල් වූ බව කියැවේ. යාපනයේ වැවුණු තාලවර්ග යේ ගසක් ද පරාල සෑදීම සඳහා ඉහළ යෝග්‍යතාවක් දැක්වූ බව ද ඔහුගේ විස්තරයට අන්තර්ගත වේ. ඒ හැරුණුවිට මධ්‍යතන යුගයේ දැවමය ශාකයක් ලෙස වැඩි ඉල්ලුමක් හිමිව තිබූ සැෆන් නම්වූ ශාක විශේෂය මෙරටට ද ආනයනය කළ බව මෙන් ම රෝපණය කිරීමට ද උත්සුක වූ බවට ජොන්ස්ටන් විසින් ගෙන එන තොරතුරු මේ සම්බන්ධයෙන් වන විරල සඳහනක් ලෙස නම් කළ හැකි වේ. චව්-ජු-ක්වාන්ට අනුව මෙම ශාකය කඳුකර සදාහරිත වනාන්තර ශාකායනය නියෝජනය කරන්නකි. තව ද, මුස්ලිම් වෙළෙඳුන් විසින් මෙම ශාකයේ දැව පුත්තලම ප්‍රදේශයෙන් ලබාගත් බවට වැඩි දුරටත් විස්තර කර තිබේ. මෙහි විශේෂත්වය නම්, අධික මැලියම් ප්‍රතිශතයක් අඩංගුව පැවතීමයි. ඒ හැරුණුවිට ශාකයේ පොත්ත රෙදි පිළි වර්ණ ගැන්වීම සඳහා භාවිත රක්ත වර්ණ ලබා ගැනීම සඳහා ද, ශාක පතුරු පොසිලේන් භාණ්ඩ බහාලුම් තැනීම සඳහා ද යොදා ගැනුණු බව කියැවේ.



ඇතුන් ලවා දැව බාල්ක ඇද්දවීම - 19වන සියවස මුල් භාගය (උපුටා ගැනීම - https://www.alamy.com/india-and-ceylon-in-the-colonial-and-universal-exhibitions-of-london-1886-elephants-carrying-or-rolling-beams .htm)

## කැස්බෑ පොතු

ක්‍රිස්තු වර්ෂ උදාව තරම් ඈත කාල පරිච්ඡේදයේ දී මෙරටින් අපනයනය කරන ලද වෙළෙඳ ද්‍රව්‍යයක් ලෙස කැස්බෑ පොතු නැතහොත් ව්‍යවහාරයේ එන කැස්බෑ ලෙළි නම් කර තිබේ. මෙම විරල සටහන අන්තර්ගත ව ඇත්තේ ස්ට්‍රබෝ (ක්‍රි.පූ.63-ක්‍රි.ව.24) නම් ග්‍රීක දාර්ශනිකයා විසින් සපයන ලද වාර්තා ඇසුරේ ය. හෙතෙම, මෙරටින් නැව් නැංවූ ද්‍රව්‍යයක් ලෙස කැස්බෑ ලෙලි නම් කොට ඇති මුත් ඇතැම් පර්යේෂකයන් පෙන්වා දෙන්නේ ස්ට්‍රබෝ විසින් වෙනත් වෙළෙඳ ද්‍රව්‍යයක් කැස්බෑ ලෙළි ලෙස වරදවා හඳුනා ගන්නට ඇති බවයි. ඒ අනුව කැස්බෑ ලෙළි වෙනුවට එවක අපනයනය කරන ලද ද්‍රව්‍ය වශයෙන් ඉදිරිපත් ව ඇති මතය නම්, තලාතුම්නිරන් විශේෂයයි. එහෙත් මේවායේ ඓතිහාසික භාවිතය පිළිබඳ නිෂ්චිත මූලාශ්‍රය ගත තොරතුරු හඳුනා ගැනීම දුෂ්කර වේ.

## මී පැණි හා මී ඉටි

ඓතිහාසික වශයෙන් ඖෂධ, ආහාර හා ආහර රසගන්වන ද්‍රව්‍යයක් වශයෙන් ඉතා ඉහළ වැදගත්කමක් ලබාගත් වෙළෙඳ ද්‍රව්‍යයක් ලෙස මී පැණි හඳුනා ගත හැකි අතර දේශීය වශයෙන් ඒවායේ භාවිතය සාහිත්‍ය මූලාශ්‍රයවලින් තහවුරු වේ, අරාබි වාර්තාවල මැදපෙරදිග කලාපය සඳහා මී පැණි සැපයූ එක් රාජ්‍යයක් ලෙස ලංකාව ද නම් කොට තිබීමෙන් මෙය අපනයන වෙළෙඳ ද්‍රව්‍යයක් ලෙසින් ද ඇගැයීමට ලක් වූ බව පෙනේ. ඉබන් බතූතාගේ වාර්තාවල ද මී පැණි හා මී ඉටි විශේෂ වෙළෙඳ ද්‍රව්‍ය වශයෙන් හඳුන්වා දී තිබේ. මී ඉටිවලට අමතර ව ලාක්ෂාද මෙරටින් විදේශ රාජ්‍ය වෙත අපනයනය කළ බව ගිරොලාමො සෙර්නිගිගේ සටහන්වලින් හඳුනාගත හැකි වේ.

## කුරුඳු හා කුළුබඩු

මෙරටින් අපනයනය කළ ද්‍රව්‍ය අතර ඉහළ ජනප්‍රියත් අත් කරගත් වෙළෙඳ ද්‍රව්‍යයක් ලෙස කුරුඳු බෝගය නම් කළ හැකි ය. සංගම් අවධියෙහි රචනා වූ පට්ටිනප්පලෙ නමැති දෙමළ ග්‍රන්ථයෙහි කාවේරි පටුන වරාය වෙත ලක්දිවින් ගෙන ගිය කුළු බඩු පිළිබඳ සඳහනක් අන්තර්ගත ව තිබේ. ඒ හැරුණු විට ආසියානු කලාපයෙන් ඔබ්බෙහි මෙරට කුරුඳු හඳුනාගත හැක්කේ ක්‍රි.ව. දහය හා එකොළහ සියවස්වලට අයත් බව විශ්වාස කෙරෙන අරාබි වාර්තාවක් ආශ්‍රයෙනි. යටත් පිරිසෙයින් ක්‍රි.ව. දහතුන්වන සියවසෙන් මෙපිටට මෙරට කුරුඳු පිළිබඳ විස්තර බොහොමයක් විදේශීය මූලාශ්‍රයවල අන්තර්ගත ව ඇත. පෘතුගීසි ජාතික දියෝගෝ ද කූතෝ (ක්‍රි.ව.1542-1616) නම් ඉතිහාසඥයා පෙන්වා දෙන කරුණු අනුව, මෙරට කුරුඳු අපනයනය ආරම්භව ඇත්තේ දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයෙනි. අරාබි වෙළෙඳුන් හා පසුව යුරෝපා ජාතීන් තරගකාරී ලෙස මෙම බෝගය ලබා ගැනීම සඳහා උත්සුක වීම, සමකාලීන වශයෙන් මෙරට

ආර්ථිකය කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කළ බව පෙනේ. කුරුඳු වෙළෙඳාම සඳහා පිහිටුවන ලද දෙපාර්තමේන්තුව හඳුන්වනු ලබන්නේ 'මහබද්දේ කාර්යාංශය' වශයෙනි. ක්‍රිස්තු වර්ෂ 1344 මෙරටට පැමිණි ඉබන් බතූතා කුරුඳු ලී ජලයේ සෝදා වැලි යට ගසා තැබීමේ සිරිතක් විස්තර කර තිබේ.

ලෝකයේ ඉතා ඉහළ ම කුරුඳු ලැබෙනුයේ සීලාන්වලින් බව පවසන ලුනාර්දු නාර්දි (ක්‍රි.ව. 1502), ගැස්පාර් ද ගාමා හෙවත් ගැස්පාර් ද ඉන්දියා (1444 -1510), තෝමේ ලෝපෙස් (1502), ගැස්පාර් කොරයා (1492-1563), අන්තෝනියෝ රෙයාල් (1512), ලොරෙන්සෝ මොරේනු (1513), දුවාර්තේ බාර්බෝසා (1518), ආදීන්ගේ ලේඛන වැදගත් තැනක් උසුලයි. ඉහත ද උපුටා දැක්වූ පරිදි, මෙරට පැවති වෙළෙඳ ආකර්ෂණය පෘතුගීසි පාලකයින් විසින් කොතරම් අගය කළා ද යන්න පෙනෙනුයේ දොන් මැනුවෙල් රජු විසින් ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදාහට ලියා එවූ ලිපියක් මගිනි. එමගින් රජු අවධාරණය කොට ඇත්තේ ලක්දිව පවතින කුරුඳු ඇතුළු කුළුබඩු බෝග පිළිබඳ ව නිසි අවධානය යොමු කරන ලෙසයි. තව ද, ඉහත උපුටා දැක්වූ පාතුගීසි ලේඛකයෙකු වූ ගිරොලාමො සේර්නිගි විසින් කුරුඳු, ඉඟුරු, ගම්මිරිස්, ඉටි ආදිය ලක්දිව සිට කැලිකට් වෙත ගෙන ආ බව සඳහන් කරන අතර, කැලිකට් ආශ්‍රිත ව වැවෙන කරුඳු හා ගම්මිරිස්වලට වඩා ලක්දිව සිට ගෙනන කුරුඳු හා ගම්මිරිස් තත්ත්වයෙන් ඉතා ඉහළ බව ද අගය කර සිටියි. ඒ අනුව කුරුඳු පමණක් නොව ගම්මිරිස් ද සමකාලීන වශයෙන් මෙරට අපනයන බෝගයක් ලෙස සංවර්ධනය වූ බව පැහැදිලි වේ. එහි ඉඟුරු සම්බන්ධයෙන් ද සටහනක් අන්තර්ගත වීම විශේෂත්වයකි.

මෙරටට පැමිණීමෙන් අනතුරුව පෘතුගීසීන් විසින් මුල්වරට කෝට්ටේ රජු සමඟ ඇති කරගත් සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස වසරකට කුරුඳු බෙර (ගණන් තබන ඒකකයෙකි) හාරසියයක් සැපයීමට රජු පොරොන්දු වූ බව කියැවේ. රජු විසින් සැපයූ පළමු කුරුඳු තොගය සමග හෙතෙම සිය සතුට ප්‍රකාශ කිරීම සඳහා ඇත් පැටවුන් දෙදෙනෙකු ද පෘතුගාලයට තෑගි කොට තිබේ. කුරුඳු වගාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ ලන්දේසීන් තම බල ප්‍රදේශවල කුරුඳු ශාකය කැපීම හෝ උදුරා දැමීම පවා නීති මගින් තහනමට ලක් කෙරිණි. ලන්දේසීන්ගේ වෙළෙඳ කටයුතුවල ප්‍රධානතම සාධකය බවට පත් වි තිබුණේ කුරුඳු ය.



කුරුඳු අපනයනය සඳහා සූදානම් කිරීම - 1884 (උපුටා ගැනීම - https://lankapura.com/packing-cinnamon-for-export)

එබැවින් කුරුඳු සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට ඔවුන් කටයුතු කළේ ය. එහි ප්‍රධානියා ලෙස වෙනම කපිතාන් වරයෙකු සිට ඇති අතර ඔහු යටතේ කුරුඳු තලන්නන්ගේ ප්‍රධානීන් ලෙස කටයුතු කළ විදානේවරුන් සිව් දෙනෙකු වූයේ ය. විදානේවරුන් යටතේ ගම්මුලාදෑනීන් සිටි අතර කුරුඳු විධිමත් අයුරින් තැලීමත් එක් රැස් කිරීමත් පැටවීමත් මෙම නිලධාරී මඬුල්ලේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු විය. ලන්දේසීන් විසින් ස්වභාවික ව වැවුනු ශාකවලට අමතර ව විධිමත් ව කුරුඳු ශාකය වගා කිරීමට ද පෙළඹීම විශේෂත්වයකි. ඒ අනුව ගාල්ලේ සිට හලාවත දක්වා වූ ප්‍රදේශවල තෝරා ගත් ස්ථාන ගණනාවක වතු වගාවක් ලෙස කුරුඳු වගා කිරීමේ කටයුතු ලන්දේසීන් විසින් අරඹණු ලැබී ය. වෙළෙඳ කටයුතු වඩාත් විධිමත් අයුරින් පවත්වා ගෙන යෑම සඳහා 'ඔෆර්හුෆ්ට්' හෙවත් 'ජෝෂ්ඨ වෙළෙන්දා' නමින් හැඳින් වූ තනතුරක් ලන්දේසි පරිපාලනය සතු වූයේ ය. ඔෆර්හුෆ්ට්ගේ ප්‍රධාන ම කටයුත්ත වූයේ පෙරදිග ඕලන්ද ඉන්දීය වෙළෙඳ සමාගම වෙත ලක්දිවින් ලැබෙන මුදල් විධිමත් අයුරින් කළමනාකරණය කොට පාලනය කිරීමයි. බ්‍රිතාන්‍යයන් ද කුරුඳු කෙරෙහි අවධානය යොමු කළ නමුදු ඔවුන්ගේ වැඩි අවධානය යොමු ව පැවතියේ අලුතෙන් හඳුන්වා දෙනු ලැබූ කෝපි, සිංකෝනා, තේ, රබර් වැනි වාණිජ බෝග කෙරෙහි ය.

## සමාලෝචනය

ඉහත සාකච්ඡා කරණ කරුණු සමාලෝචනයේ දී පරිභෝජනයෙන් ඔබ්බට අපනයනය හා ප්‍රතිඅපනයනය සඳහා විශේෂිත වෙළෙඳ ද්‍රව්‍ය පද්ධතියක් මෙරට හඳුනා ගෙන සිටි බව පැහැදිලි ය. එසේ වූයේ කාලය හා අවකාශයට සාපේක්ෂ ව විදේශීය මෙන් ම, ලෝක වෙළෙඳපොළෙහි පැවති ඉල්ලුම හා සැපයුම සම්බන්ධයෙන් සංවේදී වෙමින් බව සිතීමට කරුණු ඇත. විශේෂයෙන් අපනයන වෙළෙඳ ද්‍රව්‍ය ජනප්‍රිය කිරීමේ දී මෙරට පැවති ස්වභාවික සම්පත් කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කර ඇති බව මැණික්, මුතු, අලි-ඇතුන් හා කුරුඳු වැනි වෙළෙඳ ද්‍රව්‍ය ඇසුරේ නිගමනය කළ හැකි ය. එමෙන් ම පැරණි ලෝකයේ සක්‍රිය ව පැවති පෙර-අපර දෙදිග වෙළෙඳ ජාලයට සම්බන්ධ වීමට වූ සහජ වාසිදායක භූගෝලීය පිහිටීම හේතු කොට ගෙන සමකාලීන වශයෙන් ජනප්‍රිය වූ වෙළෙඳ ද්‍රව්‍ය ප්‍රතිඅපනයනය සඳහා උත්සුක වූ බව අලි-ඇතුන් හා අශ්ව වෙළෙඳාම ඔස්සේ උපකල්පනය කළ හැකි ය. එමෙන් ම, සාගර වෙළෙඳ කටයුතු කෙරෙහි දැක්වූ නැඹුරුව හේතු කොට ගෙන නැව් හා මුහුදු යාත්‍රා මෙන් ම දැව ආදිය සැපයීමට ඉදිරිපත් වීමේ වැඩි සම්භාවිතාවක් හඳුනාගත හැකි ය. එමෙන් ම, අමුද්‍රව්‍ය සැපයීමෙන් ඔබ්බට අපනයනය උදෙසා විවිධ නිෂ්පාදන කෙරෙහි ද අවධානය යොමුවූ බව රෙදි-පිළි, වානේ වැනි වෙළෙඳ ද්‍රව්‍ය ඔස්සේ අවබෝධ කොට ගත හැකි ය. අපනයන වෙළෙඳ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ ඉල්ලුම වැඩි වීමත් සමග ද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ නිෂ්පාදනය කෙරෙහි විධිමත් අභ්‍යන්තර යාන්ත්‍රණයක අවශ්‍යතාව පැන නගින්නට ඇති අතර, එය මෙරට අභ්‍යන්තර ආර්ථික සැකැස්ම කෙරෙහි මෙන් ම ඉන් ඔබ්බට සමස්ත සමාජායතනික දේහයට ම තීරණාත්මක බලපෑමක් ඇති කළ බව නිසැක ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

**ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය,** (පළමු කාණ්ඩය, පළමු භාගය), 1964. සංස්, හේම් චන්ද්‍රරාය, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

**ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය,** (පළමු කාණ්ඩය, දෙවන භාගය), 1972. සංස්, හේම් චන්ද්‍රරාය, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

රණවැල්ල, සිරිමල්, 2014. **පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය,** බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

ශාන්ත, ඒ. 2019, **ශ්‍රී ලංකාවේ වෙළෙඳ වාණිජ ඉතිහාසය පිළිබඳ රචනා,** කොළඹ: ලංකා බැංකුවේ මුදල් හා බැංකු කෞතුකාගාරය.

***Sri Lanka and the Silk Road of the Sea*** *Ed. Senaka Bandaranayake, Lona Dewaraja, Roland Silva, K. D. G. Wimalaratne, 2003, Colombo: Sri Lanka Institute of International Relations, Central Cultural Fund. Sri Lanka National Commission for UNESCO.*

***The Travels of Marco Polo.*** *Translated by R. Latham. 1993, London: Penguin Classics.*

***The Book of Roger: Geography of Al-Idrisi.****Ed. Nuzhat al-Mushtaq. Translated and edited by A. Kapadia. 2003, New Delhi: Cosmo Publications.*

***The Travels of Ibn Battuta,*** *A.D. 1325–1354. Translated and edited by H.A.R. Gibb. 1994 reprint. New Delhi: Cosmo Publications.*

# සැළකිලිමත්වන්න!

## මුදල් ගෙවීමට පෙර දෙවරක් සිතන්න...




## මූල්‍ය වංචාවක ගොදුරක් බවට පත් නොවන්න

**පාර්සල්/ත්‍යාග/ලොතරැයි ජයග්‍රහණ** . පාර්සල්, ත්‍යාග හෝ මුදල් ලබා ගැනීම පිණිස ගෙවීමක් කරන ලෙස ඉල්ලා සිටියි.

**රැකියා/වීසා** . රැකියාවක් හෝ වීසා ලබා ගැනීමට පූර්ව ගෙවීමක් හෝ සම්පූර්ණ මුදල ගෙවන ලෙස ඉල්ලා සිටියි. සංචාරක වීසා මගින් විදෙස් රැකියා සඳහා පිටත්ව යාමට දිරිමත් කරයි.

**මුදල් ගෙවීමට පෙර:**

1. මදක් සිතන්න:
2. මෙය වංචාවක් දැයි සිතන්න:
3. ඔබගෙන් මුදල් ලබා ගැනීමට හදිසි කරන්නේ නම් එය වංචාවක් විය හැකියි:
4. ඔබට මෙවන් වංචාවක් සම්බන්ධයෙන් තොරතුරක් ඇත්නම් හෝ එවැනි වංචාවක ගොදුරක් බවට පත්ව ඇතැයි හැගෙන්නේ නම්;

   දුරකථන අංක 011-2477509 සහ 011-2477125 හරහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයට හෝ ළඟම ඇති පොලිස් ස්ථානයට වංචාව පිළිබඳව වාර්තා කරන්න.
5. මුදල් තැන්පත් කළ හෝ කිරීමට පවසන ලද ගිණුම් අංකය, ගිණුම් හිමියාගේ නම, අදාළ බැංකුව, තොරතුරු එවන ලද ජංගම දුරකථන අංක සහ අදාළ පණිවුඩවල තිරපිටපත් (screenshots) සමඟ 0765200290 අංකයෙන් "Whatsapp" හෝ "Viber" හරහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයට දන්වන්න.

**ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ පණිවුඩයකි**

# වංචාවලට නොරැවටෙන්න!

### පාර්සල් වංචා



- වටිනා පාර්සල් සහ තෑගි
- නාඳුනන පුද්ගලයින්ගෙන් ලැබෙන පණිවුඩ
- විවිධ ගාස්තු අයකිරීම්

### ලොතරැයි වංචා




- අනපේක්ෂිත ලොතරැයි ජයග්‍රහණ
- නාඳුනන පුද්ගලයින්ගෙන් ලැබෙන පණිවුඩ
- විවිධ ගාස්තු අයකිරීම්

### රැකියා වංචා



- ඇදහිය නොහැකි තරමේ රැකියා ලාභ
- වහාම සේවයට බඳවා ගැනීමට සූදානම
- බඳවා ගැනීම ප්‍රථම පොඩි මුදලක් ඉල්ලීම

### ප්‍රේම වංචා



- විවාහ පොරොන්දු
- නිවසක් ඉදි කිරීමට සැලසුම් කිරීම
- මූල්‍ය සහාය පැතීම

### නිෂ්පාදන වංචා




- අඩු පිරිවැයක් සමග ඉහළ ප්‍රතිලාභ
- භාණ්ඩ භෞතිකව පරීක්ෂා කිරීමට ඇති අකමැත්ත
- අත්තිකාරම් මුදල් ගෙවන ලෙස ඉල්ලා සිටීම

### පුණ්‍යාධාර වංචා



- ඇදහිය නොහැකි තරමේ යහපත් පුණ්‍ය කටයුත්තක් වීම
- හදිසි පරිත්‍යාග සඳහා ඉල්ලීම්
- පෞද්ගලික මූල්‍ය තොරතුරු ඉල්ලා සිටීම

### අනන්‍යතා සොරකම



- නාඳුනන පුද්ගලයින් පෞද්ගලික තොරතුරු ඉල්ලා සිටීම
- නැතිවූ/ සොරකම් කළ හඳුනා ගැනීමේ ලේඛන
- මූල්‍ය දත්ත වෙත නීතිවිරෝධී ලෙස පිවිසීමට තැත් කිරීම

### ක්‍රිප්ටෝ (Crypto) මුදල් වංචා



- කෙටි කලක් තුළ ඉක්මන් ප්‍රතිලාභ
- ඉතා ආකර්ෂණීය අලෙවිකරණය
- නියාමන අධිකාරියක් නොතිබීම

### ආයතනික වංචා



- ආයාචිත (Spam) ඊමේල් පණිවුඩ
- දත්ත පද්ධතිවලට අනවසරයෙන් ඇතුළු වීම
- සොරකම් කළ හෝ අයථා ලෙස පරිහරණය කළ වත්කම්

**විශ්වාස කිරීමට පෙර දෙවරක් සිතන්න**

**ඔබේ පෞද්ගලික දත්ත සුරකින්න**

**ප්‍රශ්න අසන්න**

**රැල්ලට හසු නොවන්න**

**ඔබේ මුදලට කුමක් සිදු වන්නේ ද යන වග දැන ගන්න**

**සහාය පතන්න**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ පණිවුඩයකි.

www.fiusrilanka.gov.lk ☎ 0112 477125 / 0112 477509




# දැන්වීමයි

## මුදල් නෝට්ටු විකෘති කිරීම හෝ වෙනස් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සියලු ම මුදල් නෝට්ටු සහ කාසි ශ්‍රී ලංකාව තුළ ඕනෑ ම අගයක ගෙවීමක් සිදු කිරීම සඳහා වලංගු මුදල් වේ.

කෙසේ වෙතත්, විසිතුරු භාණ්ඩ සහ තෑගි අයිතම සකස් කිරීම සඳහා වලංගු මුදල් නෝට්ටු යොදා ගැනීම සහ එවැනි ක්‍රියාකාරකම් සමාජ මාධ්‍යය ඔස්සේ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රවණතාවක් කෙරෙහි ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානය යොමු වී තිබේ.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 55 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ අවසරයකින් තොරව, පහත දක්වා ඇති කටයුතු සිදු කරගෙන යෑමෙහි නියැලී සිටින ඕනෑ ම පුද්ගලයෙකු වරදක් සිදු කරයි.

(අ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් කපා දැමීම, සිදුරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් විකෘති කරනු ලැබීම.

(ආ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් මත යමක් මුද්‍රණය කිරීම, මුද්‍රාවක් තැබීම හෝ යමක් ඇඳීම හෝ යම් මුදල් නෝට්ටුවක් මත හෝ යම් මුදල් නෝට්ටුවකට යම් මුද්‍රාවක් හෝ ලකුණක් අලවනු ලැබීම.

(ඇ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවකට හෝ ඒ මත වෙළෙඳ දැන්වීමක ස්වභාවයෙන් හෝ ආකෘතියෙන් යුත් යම් දෙයක් ඇමිණීම හෝ අලවනු ලැබීම.

(ඈ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් කවර හෝ ආකාරයකින් ප්‍රතිනිර්මාණය කරන හෝ යම් මුදල් නෝට්ටුවක අනුරුවක් සෑදීම; හෝ

(ඉ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් වලංගු මුදලක් වශයෙන් නොවන අන්‍යාකාරයකින් භාවිත කිරීම.

ඉහත දැක්වූ ආකාරයේ වරදකට හසුවන යම් පුද්ගලයෙකු මෙම පනතේ 111 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරිපිට සමාලෝචන නඩුවකින් අනතුරු ව වරදකරු වීම මත, රුපියල් මිලියන විසි පහකට නොවැඩි දඩ මුදලක් හෝ තෙවසරකට නොඅඩු කාලයක් සඳහා සිරදඬුවමකට හෝ එවැනි දඩයකට සහ සිර දඬුවමකට යන දෙකට ම යටත් විය යුතු ය.

ඉහත සඳහන් ආකාරයේ නීති විරෝධී කටයුතුවල නියැලීමෙන් වැළකී සිටින ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාව වෙත දැඩි ව අවධාරණය කර සිටියි.

**ව්‍යවහාර මුදල් අධිකාරි - ශ්‍රී ලංකා මහ බැංකුව**